# ශ්‍රී පුර

සාඩම්බර අගනගරයක ජනතා ආමන්ත්‍රණය

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ**
**මාසික විද්‍යුත් ප්‍රකාශනය**

**2023 නොවැම්බර්**
**පළමු කාණ්ඩය - 1 වැනි කලාපය**





## කවරයේ කතාව



**24,25 පිටු**



කවරයේ ඡායාරූප - සමීර සඳුන් කුමාර

## කතුවැකිය

ශ්‍රී පුර

සාඩම්බර අගනගරයක ජනතා ආමන්ත්‍රණය

මාධ්‍ය ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව
රාජගිරිය

# පුරවැසියන් දැනුම්වත් කිරීමට ගන්නා නව පියවරක්

ශ්‍රී ලංකාවේ පරිපාලන අගනගරයට හිමි පළාත් පාලන ආයතනය ලෙසින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව මගින්, එයට බදු ගෙවන ජනතාව වෙනුවෙන් ඉටුවන්නා වූ වගකීම් හා සේවාවන් ප්‍රමාණය අප්‍රමාණ ය. එය ජීවිතයේ ආරම්භයේ සිට අවසන් ගමන යන තෙක්ම විහිදී පැතිරී ගිය පුළුල් මෙහෙවරකි.

එම මෙහෙවර තවදුරටත් අර්ථවත් කරවමින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව හා කෝට්ටේ පුරවැසි ඔබ අතර වඩාත් සවිමත් වූද සමීප වූද ළෙංගතු වූද සබැඳියාවක් ගොඩනැංවීම සහ ඔබගේ දැනුම් පරාසය පුළුල් කිරීම මූලික අරමුණ ලෙස පවත්වා ගනිමින් 'ශ්‍රී පුර' පුවත්නත මෙතැන් පටන් මාසික විද්‍යුත් පුවත්පතක් ලෙසින් ඔබ වෙත තිළිණ කෙරේ.

මේ වැඩපිළිවෙළ යටතේ බාල විය - යොවුන් විය - මැදි විය - වියපත් විය ගතකරන්නවුන්ගේ ජීවිතයන්හි යහපැවැත්මට හා සාමාන්‍ය දැනුම වර්ධනය කරවීමට ඉවහල් වන කාරණාවන් සම්බන්ධව දැනුම්වත් කිරීම, ශ්‍රී ජයවර්ධන පුරවරයට උරුම ඓතිහාසික, සංස්කෘතික, සාහිත්‍යයික අගය පිළිබඳ දැනුම්වත් කිරීම තුළින් ඔබ පුරවරය පිළිබඳ අභිමානයක් ජනිත කරවීම, මහා නගර සභාවෙන් ඉටුවන සේවාවන් විධිමත් කිරීමට ප්‍රජා දායකත්වය ලබා ගැනීම හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සම්බන්ධව ඔබ දැනගත යුතු කරුණු පිළිබඳ දැනුම්වත් කිරීම මෙම ප්‍රකාශය එළිදැක්වීමේ මූලික අභිලාෂයන් වන්නේය.

මේ පුවත්පත පරිශීලනය තුළින් ලබාගත් දැනුමෙන් හා අවබෝධයෙන් ඔබගේ ජීවිතයේ යහපතට, දියුණුවට ඉවහල් වන ආකාරයේ සුබදායක වෙනසක් ඇතිවනු දැක්ම අපගේ මෙම ප්‍රයත්නය මල්ඵල ගැන්වීමකි.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පුරවැසි ඔබ සැමට යහපත් හෙට දවසක් උදාවේවා!

**උපදේශකත්වය**

**ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මිය**
(නාගරික කොමසාරිස්)

**එච්. එම්. දයාරත්න මහතා**
(නාගරික ලේකම්)

**සංස්කරණය**

**නඳුන් අමන්ද මනමේන්ද්‍ර ආරච්චි**

**පිටු සැලසුම්කරණය**

**රංජිත් පුෂ්පකුමාර**
**ප්‍රදීප් අනුරුද්ධ පෙරේරා**

**ඡායාරූප**

**සමීර සඳුන් කුමාර**
**ප්‍රදීප් අනුරුද්ධ පෙරේරා**

**විශේෂාංග ලේඛකයන්**

**තිළිණ සම්පත්**
**සුනෙත් ජයකොඩි**
**අනුර යහම්පත්**
**නිර්මාණී කොඩිකාර**

## පුරවැසි ඔබ සමග ඵලදායක සබැඳියාවක ඇරඹුම



ආර්. ඒ. ශාලිකා එස්. රණවීර
නාගරික කොමසාරිස්
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
මහා නගර සභාව

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව හා එහි වෙසෙන පුරවැසියන් අතර අර්ථවත් සබඳතාවක් ගොඩනැංවීමේ අරමුණ ඇතිව ප්‍රකාශයට පත්වන 'ශ්‍රී පුර' මාසික විද්‍යුත් ප්‍රකාශනයේ මංගල කලාපය වෙනුවෙන් සුබ පැතුම් එක් කරනුයේ හද පිරි ඉමහත් සතුටිනි. ශ්‍රී ලංකාවේ පරිපාලන අගනගරය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පුරවරය පුරවැසි ඔබට වාසය කිරීම සඳහා වඩාත් සුදුසු පරිසරයක් බවට පමුණුවාලීමේ වගකීමෙන් බහුතරයක් නිල වශයෙන් පැවරී ඇත්තේ එහි පළාත් පාලන ආයතනය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවටය.

මෙම භාරදූර කාර්යය වඩාත් ක්‍රමවත්, හරවත් පදනමක් ඇතිව ඉටුකිරීම අප ආයතනය සතු මූලික වගකීමකි. ඒ උදෙසා සබුද්ධික පුරවැසි ඔබගේ සහයෝගය හා දායකත්වය මෙම මාසික ප්‍රකාශනය මගින් අප වෙත ලබාදීමට කාරුණික වන්නේ නම් ඉතාමත් අගය කොට සලකමි.




## කෝට්ටේ රාජධානියට මුලපිරූ

# නිශ්ශංක අලගක්කෝනාර

## සහ ඔහු ගොඩනැගූ කෝට්ටේ බලකොටුව

**ශ්‍රී ලාංකේය ඉතිහාස කතා පුවත තුළ කෝට්ටේ රාජධානි සමය කරුණු කාරණා කිහිපයක් නිසා ගෞරවණීයත්වයට පත්ව තිබේ. පරසතුරු උවදුරු මුලුමනින්ම දුරු කොට ලක්දේශය එක්සේසත් කිරීම, සිංහල සාහිත්‍ය නිර්මාණකරණය කෙරෙහි රාජ්‍ය අනුග්‍රහය උපරිමව ලැබී සිංහල සාහිත්‍යයෙහි ස්වර්ණමය යුගය බවට කෝට්ටේ යුගය පත්වීම ඒ අතර මූලික වේ. එලෙසම ලක් ඉතිහාසයෙහි අඳුරු කාලපරිච්ඡේදයන් කිහිපයක් ද කෝට්ටේ ඉතිහාසය තුළ සනිටුහන් වී ඇත. පෘතුගීසි පාලන සමයෙහිදී ධර්මපාල රජු විසින් කෝට්ටේ රාජධානිය තෑගි ඔප්පුවක් මගින් පෘතුගාලයට පැවරීම ඒ අතරින් ප්‍රමුඛ වේ. මේ සිදුවීම් කාලානුරූපව පෙළගස්වමින් කෝට්ටේ ඉතිහාසය කියා දෙන ලිපි පෙළක ඇරඹුමයි මේ.**

කෝට්ටේ රාජධානියට පෙර පැවතියේ ගම්පොළ රාජධානියයි. මේ රාජධානි සමයේ රජ පවුල හා ඉතා සමීපව සබඳතා පැවැත්වූ ප්‍රභූ පවුල් කිහිපයක්ම විය. 'අලකේශ්වර' හෙවත් 'අලගක්කෝනාර' පවුල මින් එකකි. මේ පවුල කෝට්ටේ රාජධානියේ පදනම ගොඩනැංවීමට සෘජුවම දායක විය.

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම ජන්ම භූමිය කොටගත් අලගක්කෝනාර පවුලේ නිශ්ශංක අලගක්කෝනාර ප්‍රභූරාජ ක්‍රි. ව. 1330 සිට ගම්පොළ රාජධානියේ 3 වැනි වික්‍රමබාහු රජු වෙනුවෙන් රට තුළ දේශපාලන යාන්ත්‍රණය මෙහෙයවූ නියමුවා බවට පත්ව සිටියේය. ඔහු 3 වැනි වික්‍රමබාහු රජුගේ සහෝදරියක හා විවාහ වී සිටියේය (මේ රජුගෙන් අනතුරුව රාජ්‍යත්වයට පත්වූ 5 වැනි බුවනෙකබාහු එකී සහෝදරියට නිශ්ශංක අලගක්කෝනාරගෙන් ලද පුත්‍රයකු බවට පිළිගැනීමක් ඇත).

ගම්පොළ රාජධානි යුගය වන විට ලක්දිව යාපන අර්ධද්වීපය ආර්යචක්‍රවර්තී නම් ප්‍රාදේශීය පාලකයකු යටතේ පැවතිණි. ඉතා ප්‍රබලයකු වූ ඔහුගේ සහයෝගය ඇතිව 3 වැනි වික්‍රමබාහු රජු, 5 වැනි පරාක්‍රමබාහු රජු සිහසුනෙන් නෙරපා හැර ගම්පොළ රාජ්‍යත්වය හිමි කර ගත්තේය.

ක්‍රි. ව. 1360 දී එළඹුණු ගිවිසුමකට අනුව 3 වැනි වික්‍රමබාහු රජු, උඩරට ප්‍රදේශයේ සිදුරුවාන, බලවිට, මාතලේ, දුම්බර, සගම තුන්රට යන ප්‍රදේශවල අය බදු එක්රැස් කර ගැනීමේ බලය මාර්තණ්ඩ පෙරුමාල් නමැත්තකුහට පවරා තිබේ. මේ තැනැත්තා උතුරේ ආර්යචක්‍රවර්තී බවට පිළිගැනීමකි. 3 වැනි වික්‍රමබාහු ඔහුට මේ සුවිශේෂ වරප්‍රසාදය හිමි කර දී ඇත්තේ තමාහට ගම්පොළ සිහසුන අත්පත් කර ගැනීමට කළ උපකාරයට කෘතගුණ සැලකීමක් ලෙසින් විය හැකි ය. ඉතා කෙටි කාලසීමාවක් තුළදී ආර්යචක්‍රවර්තීගේ බලය ක්‍රමයෙන් ලංකාවේ දකුණු දෙසට ව්‍යාප්ත විය. ඒ අනුව හලාවත, මීගමුව, වත්තල, කොළඹ යන බටහිර තොටුපොළවල බලය ද ආර්යචක්‍රවර්තී සන්තක විය.

මේ ආකාරයට ලංකාවේ බටහිර තොටුපොළ කේන්ද්‍ර කරගනිමින් සරු ආදායම් උපයාගත් ආර්යචක්‍රවර්තීගේ බලය මෙල්ල කිරීමට වෙළෙඳ පරපුරක පුරුකක් වූ නිශ්ශංක අලගක්කෝනාර නිරතුරුවම මාන බැලුවේය. මේ උදෙසා ඔහු ගත් වැදගත් ක්‍රියාමාර්ගයක් වූයේ කොළඹට නොදුරු ප්‍රදේශයක බලකොටුවක් ඉදිකිරීම ය. ඒ සඳහා ඔහු තෝරාගත්තේ 'දාරුගම' හෙවත් 'කෝට්ටේ' ය.

මේ සඳහා කෝට්ටේම තෝරාගැනීමට කරුණු කාරණා කිහිපයක්ම බලපෑවේය. විදේශ වෙළෙඳාමෙහි ඉහළ ඉල්ලුමක් තිබූ කුරුඳු ප්‍රමුඛ කුළුබඩු කෝට්ටේ අවටින් පහසුවෙන් සොයා ගත හැකි විය. විදේශ වෙළෙඳාම අතින් වැදගත් වූ කොළඹ වරාය පිහිටියේ කෝට්ටේ ට ඉතාමත් නොදුරිනි. කොළඹ හා කෝට්ටේ අතර ප්‍රවාහණය ජල මාර්ග ඔස්සේ පාරුවලින් කළ හැකි විය. එම නිසා කෝට්ටෙන් සපයාගත් වෙළෙඳ භාණ්ඩ පහසුවෙන් කොළඹ වරාය කරා ප්‍රවාහණය කළ හැකි විය.

3 පිටුවට




කෝට්ටේ වෙත උරුම ස්වාභාවික රැකවරණය අලගක්කෝනාර තම බලකොටුව ගොඩනැංවීමට බලපෑ ප්‍රබල හේතුවක් විය. කෝට්ටේ, තුන් පැත්තකින් දියවන්නා ඔයෙන් ද අනෙක් පැත්තෙන් ස්වාභාවික මඩගොහොරුවකින් ද වට වූ භූමියකි.

මේ දැවැන්ත බලකොටුව ඉදිකිරීම සඳහා නිශ්ශංක අලගක්කෝනාර දේශීය මෙන්ම විදේශීය විශේෂඥයින්ගේ සහයෝගය ලබාගත් බව නිකාය සංග්‍රහය සහ සද්ධර්මරත්නාකරය සඳහන් කරයි.

මේ බලකොටුව මුළුමනින්ම පාහේ කළු ගලින් නිමවා ඇත (ඇතැම් ලේඛනවල මෙහි පාදම කළුගලින් කරවා ඇති බවද දැක්වේ). පළමුකොට කොටු තාප්පය තනවා එය වටා දිය අගලක් ද ගැඹුරු මඩ අගලක් ද කැණවී ය. රැකවරණය උදෙසා ඒ තුළ කිඹුලන් ඇති කරවා තිබේ. මේ දිය අගල ඉතා ගැඹුරු වූවකි. එහෙයින් දියෙන් පැමිණ තාප්පයට නැඟිය නොහැකි විය.

තාප්පය මත දිය අගල දෙසට එල්ල වන ලෙසට ඊතල සවිකර තිබිණි. ඒ හැරුණු විට තාප්පය මත උල් විශේෂයකි. 'පුලිමුඛම්' නම් වූ මේවා ගැඹුරු වළවල් ය. මෙම කොටු පවුරු මත 'ඉඩංගනී' නම් වූ ගල් විදින යන්ත්‍ර කිහිපයක් ස්ථාපනය කොට තිබිණි. බොහෝ දුර සිටියවුන්ට වුව ඒවායින් විදිය හැකි විය. කොටු පවුර මත අට්ටාල තනවා විසිහතර පැය පුරාම ආරක්ෂකයින් රඳවා තැබිණි.

මේ සෙනෙවියන්ගේ මානසික ශක්තිය හා ධෛර්යය වර්ධනය කරවනු පිණිස කොටු පවුරේ සතර කොන්වල කිහිරැලි උපුල්වන්, සමන්, විභීෂණ හා ස්කන්ධ දෙවියන් වෙනුවෙන් දේවාල තනවා තිබිණි.

කොටු පවුරේ සතර දෙසට මුහුණ ලා වාසල් (දැවැන්ත දොරටු) සතරකි. දකුණු දිසාවට මුහුණ ලා ඉදිකර තිබූ වාසලින් වර්තමාන පිටකෝට්ටේ දෙසට යා හැකි විය. මෙය බලකොටුවේ ප්‍රධාන දොරටුව ය. 'මඟුල් දොරටුව' නම් වූ එයින් අශ්වයින්ට, ඇතුන්ට හා වෙනත් වාහනවලට පිටතට යා හැකි විය. එම දොරටුව අසල වූ දිය අගල රියන් 18 ක් පමණ පුළුල් වූවකි. ඒ මතින් ඉදිකෙරුණු පාලම අවශ්‍ය විටදී උස් පහත් කළ හැකි විය.

අනෙක් වාසල් තුන විවර වූයේ කෙලොන්නා ඔයට හා දියවන්නා ඔයට ය. ඒවායින් ඉතා වැදගත් වූයේ උතුරු වාසල ය. එය විවර වූයේ කොන්තගංතොට දෙසට ය (වර්තමානයේ ශ්‍රී ජයවර්ධනපුර මාවත ඔස්සේ රාජගිරිය දෙසින් පැමිණි විට පාර්ලිමේන්තුවට පිවිසීමට ඇති මාර්ගය ආරම්භ වන ඉසව්ව කොන්තගංතොට ලෙසින් පුරාවිද්‍යාඥයින් හඳුනාගෙන තිබේ). ඒ මතින් කැලණි ගඟ ඔස්සේ කොන්තගංතොට වෙත රැගෙන ආ අත්‍යවශ්‍ය භාණ්ඩ බලකොටුව වෙත ලබාගත්තේය.

බලකොටුව තනා නිම වූ පසු ආර්යචක්‍රවර්තීගේ බදු එකතු කරන්නන් පළවා හැරීමට පෙර මේ කාර්යය සඳහා අවශ්‍ය සේනාව හා අවි ආයුධ රැස්කර ගත්තේය. එසේම දීර්ඝ කාලයකට ප්‍රමාණවත් වන තරම් ආහාර පාන, ඉවුම් පිහුම්වලට අවශ්‍ය උපකරණ ආදිය සපයා ගත්තෙය. බලකොටුව තුළ කණින ලද ළිංවලින් ජලය ලබාගැනිණි.

බලකොටුවේ ශක්තිමත්භවය සහ ආරක්ෂාව පිළිබඳ සෑහීමකට පත්වූ පසු නිශ්ශංක අලගක්කෝනාර, ආර්යචක්‍රවර්තීහට පහර දීමට මුලපිරුවේය. අලගක්කෝනාරගේ හමුදාවන් දියෙන් හා ගොඩබිමෙන් එල්ල කළ ප්‍රහාර මාලාවකින් ආර්යචක්‍රවර්තීගේ භට පිරිස් පසුබැස්සහ. එසේ වුවද කල් යල් බලා ඔවුහු කෝට්ටේ බලකොටුවට පහර දුන්නද එයට ඉන් කිසිදු හානියක් සිදුනොවීය. මේ සටන් මාලාවෙන් අලගක්කෝනාර විශිෂ්ට ජයග්‍රහණයක් ලද්දේ ය.

**නළුන්**

**කෝට්ටේ ඓතිහාසික උරුම**

# කෝට්ටේ රාජ මහා විහාරය



ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ඓතිහාසික පුරවරයට උරුම පුදබිම් අතර කෝට්ටේ රාජ මහා විහාරයට උරුම වනුයේ සුවිශේෂ වැදගත්කමකි. මෙය කෝට්ටේ රාජධානියෙහි කීර්තිමත්ම පාලකයා වූ 6 වැනි මහා පරාක්‍රමබාහු නිරිඳුන්ගේ මූලිකත්වයෙන් ඉදිවූ පුදබිමක් ලෙසින් බුහුමන් ලබයි.

පිටකෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාල විදුහල් භූමියට යාබදව පිහිටි මෙම පුදබිම වෙත සාන්ත තෝමස් දේවස්ථානය අසලින් ආරම්භ වන මාර්ගයෙන් ද පිවිසිය හැකි ය.

කෝට්ටේ රාජධානි සමයෙහි විරාජමානව පැවැති මෙම පුදබිම පරසතුරු උවදුරුවලින් වැනසී වල් වැදී අප්‍රකට තත්ත්වයට පත් විය. මෙවන් දුර්භාග්‍යසම්පන්න ඉරණමකට ලක් වූ මෙම ස්ථානය නැවත සොයා දැනගෙන දියුණු කිරීමට මුල් වූයේ 1813 දී පිලානේ ධර්මකීර්ති ශ්‍රී බුද්ධරක්ඛිත මාහිම්පාණන් වහන්සේ ය.

මෙහි පිහිටි දහඅට රියන් සැතපෙන බුද්ධ ප්‍රතිමා වහන්සේ, හිටි පිළිම වහන්සේලා මෙන්ම හිඳි පිළිම වහන්සේ මහනුවර යුගයේ කලා සම්ප්‍රදායට අයත් වේ. ඒවා අතර නූතන සම්ප්‍රදාය නියෝජනය කරන ප්‍රතිමා ද වේ.


මෙහි බුද්ධ මන්දිරයෙහි වම් පස උළුවස්ස මුදුනත 'ජයවර්ධනපුර කෝට්ටේ රජ මහා විහාරය' ලෙසින් සඳහන්ව ඇත්තේ ඉංගිරිසි බසිනි. මෙහි දකුණු පස උළුවස්සෙහි වික්ටෝරියා මහ රැජිනගේ රුව ඇතුළත් ලාංඡනයක් වෙයි. ලක්දිව පාලනය බ්‍රිතාන්‍යයන්ට මුලුමනින්ම හිමි වූ පසු මෙම නිර්මාණයන් කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

විහාරයේ පිටත මාලයෙහි සිතුවම් ජාතක කතා අනුසාරයෙන් නිර්මාණය කර ඇත. මේවා මහනුවර සිතුවම් සම්ප්‍රදායට අනුකූලව නිර්මිත ය.

විහාරයට අයත් නා බෝධිය බැතිමතුන් අතර ඉමහත් ගෞරවාදරයට පාත්‍රව ඇත. සපුමල් කුමරු යාපනය යටත් කරගැනීමට යාමට ප්‍රථම මෙම බෝධියට භාරයක් වූ බවත් එම සටන ජය ගෙන යළි මෙම විහාර භූමියෙහි සිය මඟුල් කඩුව තැන්පත් කොට එතැන දේවාලයක් කරවූ බවත් වංසකථාවල දැක්වේ.

කෝට්ටේ රාජධානි සමයෙහි ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඩසිටියදී පැවැත්වූ දළදා පෙරහර සිහිපත් කෙරෙමින් අද මෙම ඓතිහාසික විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන වෛභාසික කෝට්ටේ ශ්‍රී දළදා මහා පෙරහර වාර්ෂිකව පැවැත්වේ.

**නිර්මාණී කොඩිකාර**




ලක් දේශයේ නිදහස වෙනුවෙන්
දිවිහිමියෙන් කැප වූ

# කෝට්ටේ සිංහයා
# ඊ. ඩබ්ලිව්. පෙරේරා

අවිචාරවත්, අත්තනෝමතික බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයේ නොපනත්කම්වලට එරෙහි වූ අපගේ ජන නායකයින් රැසක්ම කිසිදු පැහැදිලි, සාධාරණ චෝදනාවලින් තොරව 1915 දී බන්ධනාග ාරගත කෙරිණි. මේ දරුණු තත්ත්වය තවදුරටත් නොඉවසුවෙක් මෙකී අසාධාරණයට සාධාරණයක් ඉල්ලා සිටිමින් එංගලන්තය කරා, මරණය අත මිට මොළවාගත් ගමනක නිරත වී සාර්ථක ප්‍රතිඵල අත්පත් කරගත්තේය. හේ, 'කෝට්ටේ සිංහයා' යන විරුදාවලියෙන් පුද ලද ඊ. ඩබ්ලිව්. පෙරේරා ය.



1875 දෙසැම්බර් 12 වැනි දින උපන් මොහු එඩ්වඩ් වෝල්ටර් පෙරේරා නම් විය. පියා ධනයෙන් අනූන, සුපතළ නීතිඥවරයකු ලෙසින් කීර්තියක් උරුමව සිටි ඊ. එෆ්. පෙරේරා ය. මව ජොහානා මැටිල්ඩා ය. දරුවන් දොළොසකින් යුත් පවුලක වැඩිමලා වූයේ ඊ. ඩබ්ලිව්. පෙරේරා ය.

මොහු ඉගෙනුම ලැබුවේ කොළඹ රාජකීය විද්‍යාලයෙනි. අයර්ලන්ත ජාතික කාන්තාවකගෙන් ඉංගිරිසි භාෂාව ද හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන් වෙතින් සිංහල භාෂාව ද උගෙන පියාගේ අඩි පාරේ යමින් නීති අධ්‍යාපනය වෙත යොමුව 1900 දී එනම් විසිපස් හැවිරිදි වියේදී නීතිඥවරයකු ලෙස දිවුරුම් දුන්නේය. 1908 දී එංගලන්තයට ගොස් බැරිස්ටර් විභාගය සමත් වී යළි මවුබිමට පැමිණියේය.

දක්ෂ අධිනීතිඥවරයකු වූ ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතා කා අතරත් ගෞරවාදරයට පාත්‍ර වූ චරිතයකි. හෙතෙම නීතිඥ වෘත්තියේ නියැළීමට වඩා වඩාත් ප්‍රිය කළේ ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් මුදවා ගැනීමේ සටනට එක්වීමට ය.

1915 දී මුස්ලිම්වරුන්ට එරෙහිව මහනුවරින් ඇරඹුණු අරගලය ඉතාමත් කෙටි කලකින් මුළු රට පුරාම ව්‍යාප්ත විය. මේ මහා කැළඹීමට මුල් වූවන් ලෙස චෝදනා ඉදිරිපත් කරමින්, එවකට මෙරට ක්‍රියාත්මක වූ ඉංග්‍රීසීන්ගේ අත්තනෝමතික පාලනයට එරෙහිව නැඟී සිටි ඩී. එස්. සේනානායක, එෆ්. ආර්. සේනානායක, හෙන්රි පේද්‍රිස්, ඩී. බී. ජයතිලක, සී. ඒ. හේවාවිතාරණ, නීතිඥ ජෝන් ද සිල්වා, පියදාස සිරිසේන, බත්තරමුල්ලේ ශ්‍රී සුභූති හිමියන් ඇතුළු පිරිසක් බන්ධනාගාරගත කෙරිණි. එපමණක් නොව මෙම අරගල සමයේදී සිංහලයන් දුටු තැන වෙඩි තැබීමට ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා පොලීසියට නියෝග කළේය.

ඉංග්‍රීසි ආණ්ඩුව ගෙන ගිය මෙකී දුර්දාන්ත පාලනය පිළිබඳ එංගලන්තය දැනුම්වත් කිරීම මේ යුගය වන විට දැඩි කාලීන අවශ්‍යතාවක් බවට පත්ව තිබිණි. මේ අතිශය අවදානම්, භාරදූර කටයුත්ත ඉටුකිරීමට ඉදිරිපත් වූයේ ඊ. ඩබ්ලිව්. පෙරේරා ය. ඒ පිළිබඳ

7 පිටුවට

සකස් කළ පෙත්සම හෙතෙම විශේෂයෙන් සකස් කරවූ සපත්තුවක පතුලේ සඟවාගෙන එංගලන්තයට ගියේය. එහිදී 1915-1919 දක්වා වූ සිවු වසරක් එහි ගතකරමින් එරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හමුවේ ලංකාවේ තත්ත්වය හෙළිදරවු කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස එංගලන්ත රජය අප රටට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් පිරිනැමීමට එකඟ විය. ඒ අනුව 1920 අගෝස්තු 13 වැනි දින රාජඥා-වක් මගින් අපහට ස්ථාවර ව්‍යවස්ථාදායක සභාවක් හිමි විය.

ඊ. ඩබ්ලිව්. පෙරේරා එංගලන්තයේ ගතකළ සිවු වසර තුළ තවත් වැදගත් කටයුත්තක නිරත විය. එනම්, 1815 මාර්තු 02 වැනි දින මහනුවර මඟුල් මඩුව අසලදී පහතට හෙළනු ලැබ, පසුව ඉංග්‍රීසීන් විසින් එංගලන්තයට රැගෙන යනු ලැබූ එවකට අප භාවිත කළ සිංහ ධජය සොයා ගැනීම ය. ඔහු එය සොයා ගන්නා ලද්දේ එංගලන්තයේ චෙල්සි රෝහලේ ගබඩාවක තිබියදී ය. අපගේ වත්මන් ජාතික ධජය නිර්මාණයෙහිලා මේ ධජය පදනම් කරගැනිණි.

ලංකා ජාතික සංගමයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ යුගයේ මෙරට ඩොනමෝර් කොමිසම ඉදිරියේ සාක්ෂි දෙමින් ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතා කියා සිටියේ ලංකාවට අවශ්‍ය පූර්ණ නිදහසක් මිස ඩොමීනියන් තත්ත්වයක් නොවන බව ය. නමුත් සංගමයේ සෙසු සාමාජිකයෝ මේ මතය හා එකඟ නොවූහ. මේ තත්ත්වය හමුවේ හෙතෙම එම සංගමයෙන් ඉවත් විය.

ඒ සමගින් රාජ නීතිඥ ෆ්‍රැන්සිස් ද සොයිසා, රාජ නීතිඥ එම්. ටී. ද එස්. අමරසේකර, ආර්. එල්. පෙරේරා යන අය ද ලංකා ජාතික සංගමයෙන් ඉවත්ව 'නිදහස් සංගමය' පිහිටුවා ගත්හ.

1931 දී පැවැති රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණය සඳහා නිදහස් සංගමය නියෝජනය කරමින් ඊ. ඩබ්ලිව්. පෙරේරා ඇතුළු විශාල පිරිසක් ඉදිරිපත් වූහ. ඊ. ඩබ්ලිව්. පෙරේරා තරග කළේ කළුතර දිස්ත්‍රික්කයේ හොරණ කොට්ඨාසයට ය. එහිදී ඔහු තම ප්‍රතිවාදියාට වඩා වැඩි ඡන්ද 5501 ක් ලබා ගනිමින් ජය ගත්තේය.

1936 දී පැවැති රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයේදී ඊ. ඩබ්ලිව්. පෙරේරා පරාජය විය. අනතුරුව 1943 දී පැවැති රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කැලණිය අතුරු මැතිවරණයට ද ඉදිරිපත් විය. ප්‍රතිවාදියා වූයේ දේශපාලනයට නවකයකු වූ ජේ. ආර්. ජයවර්ධන ය.

ලේක් හවුස් අධිපති ඩී. ආර්. විජේවර්ධනට උවමනා වූයේ ජාතික නිදහස වෙනුවෙන් දිවි දෙවැනි කොට කැප වූ ඊ. ඩබ්ලිව්. පෙරේරා මැති සභයට යැවීමට ය. "ජයවර්ධන, ඔයා තරගයෙන් ඉවත් වෙලා ඊ. ඩබ්ලිව්. ට තරග කරන්න ඉඩ දෙන්න" විජේවර්ධන ඉල්ලා සිටියේය. ලේක් හවුස් පුවත්පත් සහයෝගය දුන්නේ ද ඊ. ඩබ්ලිව්. පෙරේරාට ය.

එවකට ශ්‍රී ලංකා ජාතික සංගමයේ ප්‍රබලයකුව සිටි ජේ. ආර්. ජයවර්ධනට තරග බිමෙන් ඉවත් වන්නට ඒ සංගමයේ සාමාජිකයෝ ඉඩ නොදුන්හ. මැතිවරණයෙන් ජයවර්ධන ජය ගත්තේය.

දේශපාලනයට සමු දුන් ඊ. ඩබ්ලිව්. පෙරේරා දිවියේ ඉතිරි කාලය පොත් පත් ලිවීමටත් ශාස්ත්‍රීය ගවේෂණ කටයුතුවලටත් කැප කළේය. 1953 පෙබරවාරි 16 වැනි දින හෙතෙම අභාවයට පත්විය.

එදා හේ විසූ ඇතුල්කෝට්ටේ නිවස අද 'කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාරය හා කෝට්ටේ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය' බවට පත්ව තිබේ.

## නඳුන්

**අද කෝට්ටේ 'පුරාවිද්‍යා කෞතුකාගාරය හා ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය' බවට පත්ව ඇති එතුමන්ගේ නිවහන.**




# කෝට්ටේදී පැවැත්වූ ලංකාවේ මුල්ම රාජ්‍ය සාහිත්‍ය උළෙල





කෝට්ටේ යුගය අමතක කර සිංහල සාහිත්‍යයක් පිළිබඳ සිහිපත් කිරීම අසම්පූර්ණ වෑයමකි. එපමණටම කෝට්ටේ යුගය හා සිංහල සාහිත්‍යය අතර ඇත්තේ ගසට ඇලුණු පොත්ත මෙන් වූ අවියෝජනීය බැඳීමකි.



වැලිවිටියේ සෝරත හිමි



බණ්ඩාරනායක මැතිතුමා

පරෙවි - කෝකිල - සැළලිහිණි - ගිරා - හංස සන්දේශ කාව්‍යයන්, කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍යය, ලෝවැඩ සඟරාව, බුදුගුණ අලංකාරය යන පද්‍ය නිර්මාණයන්ද කුවේණි අස්න, සද්ධර්මරත්නාකරය යන ගද්‍ය කෘතීන්ද කෝට්ටේ යුගය හෙළ සාහිත්‍යයේ 'ස්වර්ණමය යුගය' බවට පමුණුවාලූ මහඟු නිර්මාණයන්ය.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වීදාගම මෛත්‍රෙය හිමි, වෑත්තෑවේ හිමි, ඉරුගල්කුලතිලක පිරිවෙන් අධිපති හිමි, ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී පඬිතුමා පෙර කී නිර්මාණයන් දැයට දායාද කළ මහා වියත්හුය.


කෝට්ටේ යුගයේ හෙළ සාහිත්‍යයේ උන්නතියට රාජ්‍ය අනුග්‍රහය පළ කළේ 6 වැනි පරාක්‍රමබාහු නිරිඳුන්ය (ක්‍රි. ව.1415-1467). මෙකී වෑයමෙන් නොනැවතුණු හෙතෙම ද සාහිත්‍යකරණයෙහි නියැළුණේය. රුවන්මල් නිඝණ්ඩුව මෙයට නිදසුනකි.


මේ හැරුණු කල අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණි, යාපහු, කුරුණෑගල, ගම්පොළ, මහනුවර යන පාලන යුගයන්හි බිහි වූ සාහිත්‍ය නිර්මාණ ගණන අතිමහත්ය. යුරෝපා ආක්‍රමණයන් තුළින් ස්ථාපනය වූ බටහිර අධිරාජ්‍යවාදී පාලන රටාවට මෙරට නතු වීමේ ප්‍රතිඵලයක් ලෙස අපගේ හෙළ සාහිත්‍යයේ උන්නතිය පරිහානිය කරා යන්නට විය. ඒ වෙනුවට බටහිර අධ්‍යාපනය හා බටහිර සංස්කෘතිය රට තුළ මුල්බැස ගත්තේය.

මෙවන් අභාග්‍යසම්පන්න වූ වාතාවරණයක් තුළ හෙළ සාහිත්‍යය නව පණක් ලැබුවේ 1956 න් මුලපිරුණු බණ්ඩාරනායක යුගයේදීය. එම කාලසීමාවේදී අග්‍රාමාත්‍ය එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමන් ඉදිරිපත් කළ කැබිනට් යෝජනාවක් අනුව 1957 දී සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබිණි.


9 පිටුවට

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කෙරුණු මුල්ම රාජ්‍ය සාහිත්‍ය මහෝත්සවය 1957 සැප්තැම්බර් 07 හා 08 දිනවලදී ඇතුල්කෝට්ටේ සිරි පැරකුම්බා පිරිවෙනේදී හා පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙනේදී පැවැත්විණි.


පණ්ඩිත පුංචිබණ්ඩාර සන්නස්ගල මැතිතුමා


සෙනරත් පරණවිතාන මැතිතුමා

මෙහි ආරම්භක උත්සවය අග්‍රාමාත්‍ය එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අගෝස්තු 07 වැනි දින ඇතුල්කෝට්ටේ සිරි පැරකුම්බා පිරිවෙනේදී පැවැත්විණි. මෙහි ප්‍රධාන තේමාව වූයේ 'කෝට්ටේ යුගයේ සාහිත්‍යය' යි.


එවකට සංස්කෘතික අමාත්‍යවරයාව සිටි ජයවීර කුරුප්පු මැතිතුමා අතින් මාර්ටින් වික්‍රමසිංහ සූරීන් වෙත මුදල් ත්‍යාගය පිරිනැමූ අවස්ථාව.

එම උළෙලේ පෙරවරු සැසිවාරයේ ආරම්භක දේශනය පවත්වන ලද්දේ මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ය. එහි තේමාව 'කෝට්ටේ යුගය'යි. එම සැසිවාරයේ මුලසුන හොබවනු ලැබුවේ සුපතළ ලේඛක ජුලියස් ද ලැනරෝල් සූරීන් විසිනි.

එදින පස්වරු සැසිවාරය පැවැත්වුණේ පෑලියගොඩ විද්‍යාලංකාර පරිවේනාධිපති පූජ්‍ය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර මාහිමියන්ගේ මූලිකත්වයෙනි. එහිදී පූජ්‍ය වැලිවිටියේ සෝරත මාහිමියන් පැවැත්වූ දේශනයේ තේමාව වූයේ 'කෝට්ටේ යුගයේ සන්දේශවලින් බැහැර වූ අන්‍ය සාහිත්‍ය කෘති' ය.

මෙම උළෙලේදී සාහිත්‍ය උපදේශක සභාව විසින් පළකෙරුණු 'සාහිත්‍ය' නම් ත්‍රෛමාසික සඟරාවේ මංගල කලාපය හා ප්‍රවීණ ලේඛක රැයිපියෙල් තෙන්නකෝන් සූරීන් විසින් සංස්කරණය කෙරුණු 'සිරි රහල් පබඳ' නම් වූ ශාස්ත්‍රීය සංග්‍රහයද දොරට වැඩියේය. මෙදින රාත්‍රිය වර්ණවත් වූයේ 'අලකේෂ්වර' නම් වේදිකා නාට්‍යය රඟදැක්වීමෙනි.

සැප්තැම්බර් 08 වැනි දින රාජ්‍ය සාහිත්‍ය උළෙල ඇරඹීමට පෙර සැලළිහිණි හා කොවුල් රූප රැගත් විචිත්‍රවත් පෙරහරක් ඇතුල්කෝට්ටේ සිරි පැරකුම්බා පිරිවෙනේ සිට පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන දක්වා ගමන් ගත්තේය.

මෙදින උත්සව සභාවේ විශේෂ දේශනය පවත්වන ලද්දේ පණ්ඩිත පුංචිබණ්ඩාර සන්නස්ගල සූරීන්ය. එහි තේමාව වූයේ 'කෝට්ටේ සන්දේශ සාහිත්‍යය' යි.

'රසවාහිනී' සඟරාවේ පළ වූ 'බමුණු කුලයේ බිඳවැටීම' නමැති ලිපිය උදෙසා සංස්කෘතික කටයුතු ඇමැති ජයවීර කුරුප්පු මැතිතුමා වෙතින් හෙළයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ සූරීන් රුපියල් පන්දහසක ත්‍යාගයක් ලැබීම මෙම උළෙලේ සුවිශේෂ කරුණක් විය.

බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමන් හෙළ සාහිත්‍යවේදීන්හට කිරුළු පළඳවන රාජ්‍ය සාහිත්‍යඋළෙලට කෝට්ටෙන් මුලපිරුවේය. ඒ, ලක්දිව හෙළ සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ යුගය වූ හෙයිනි.

අද රටේ යම් ප්‍රදේශයන් කේන්ද්‍ර කරගනිමින් වාර්ෂිකව රාජ්‍ය සාහිත්‍ය උත්සව පැවැත්වේ. මේ ශාස්ත්‍රීය කර්තව්‍යයට කෝට්ටෙන් මුලපිරීම එහි පුරවැසියන් ලෙසින් අපහට සදාකල්හිම අභිමානවත්ව සිහිපත් කළ හැකි වන්නේය.

මෙහි ඇතුළත් ඇතැම් පැරණි ඡායාරූපවල සංරක්ෂණය කෝට්ටේ මහ නගර සභාවේ මාධ්‍ය ඒකකය විසිනි.

නළුන්




# රාජගිරිය මධ්‍ය පුස්තකාලය

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවට අයත් මහජන පුස්තකාල හතරකි. ඒවා නුගේගොඩ, උඩහමුල්ල, බැද්දගාන යන ප්‍රදේශවල පිහිටුවා තිබේ. මේ අතරින් 'රාජගිරිය මධ්‍ය පුස්තකාලය' ප්‍රධානත්වය උසුලයි. සෙසු පුස්තකාල ත්‍රිත්වය පාලනය වන්නේ මෙම මධ්‍ය පුස්තකාලය මගිනි.**


ප්‍රධාන පුස්තකාලයාධිපති සුජීව ප්‍රනාන්දු මහතා



රාජගිරිය මධ්‍ය පුස්තකාලය ප්‍රධාන අංශ කිහිපයකින් සමන්විත ය. 'පුවත්පත් අංශය' මින් එකකි. මෙමගින් සතිපතා හා දිනපතා සිංහල-දෙමළ-ඉංග්‍රීසි පුවත්පත් නොමිලේ කියවීමේ අවස්ථාව පාඨකයින්ට හිමි වේ. මේ අංශය පරිහරණය කිරීම සඳහා පුස්තකාල සාමාජිකත්වය අවශ්‍ය වන්නේ නැත.

'බැහැර දෙන අංශය' පුස්තකාලයේ තවත් වැදගත් අංශයකි. මෙය වැඩිහිටි පාඨකයන් සඳහා විවෘත ය. විවිධ විෂයයන්ට අයත් දැවැන්ත පොත් එකතුවක් මේ අංශය සතු ය. මේ වර්ෂයේදී සැලකිය යුතු පොත් ප්‍රමාණයක් මේ අංශය සඳහා මිලදී ගෙන ඇත. ඒ අතර මේ වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මානලාභී මෙන්ම විවිධ සම්මාන සඳහා නිර්දේශිත වූ පොත් ද රාශියකි.

'ළමා අංශය' වයස අවුරුදු 05 ට වැඩි 14 ට අඩු දරු දැරියන් සඳහා විවෘත ය. දරුවන් සඳහා වන අධ්‍යාපනික, රසවින්දනාත්මක වශයෙන් වැදගත් වන පොත් පත් රැසකින් මෙම අංශය පොහොසත් ය.

'විමර්ශන අංශය' පරිහරණය සඳහා පුස්තකාල සාමාජිකත්වය අනිවාර්ය වන්නේ නැත. විවිධ විෂයයන් අළලා ලියවුණු පොත් පත් රැසකින් සමන්විත මේ අංශය විශේෂයෙන් යම් යම් විෂයයන්ට අදාළ කරුණු ගවේෂණය කරන්නන්හට මාහැඟි දායාදයක් බඳු ය. මෙහි ඇති පොත් කවර හේතුවක් නිසා හෝ පුස්තකාල පරිශ්‍රයෙන් පිටතට ගෙන යා නොහැකි ය. එම පොත්වල අන්තර්ගත අවශ්‍ය කරුණු සටහන් කරගත හැකි ය (මේ සඳහා පැන්සල් පමණක් භාවිතයට අවසර දී තිබේ).

සාමාන්‍ය පෙළ, උසස් පෙළ ආදි විභාගවලට පෙනී සිටින දරුවෝ මේ පුස්තකාලය සතු 'අධ්‍යයන අංශය' මගින් විශාල ප්‍රයෝජනයක් අත්පත් කර ගනිති.

කෝට්ටේ මහා නගර සභාවට අයත් පුස්තකාලවල බැහැර දෙන අංශ, විමර්ශන අංශ හා ළමා අංශ සඳහා අවශ්‍ය පොත් මිලදී ගන්නේ රාජගිරිය මධ්‍ය පුස්තකාලයේ මැදිහත් වීමෙනි. ඒ සඳහා මහා නගර සභාවේ අය වැය ලේඛනයෙන් වාර්ෂිකව රුපියල් ලක්ෂ 40 ක පමණ මුදලක් වෙන් කෙරේ. මේ පුස්තකාල හා කියවීම් ශාලාවලට (කෝට්ටේ මහා නගර සභාවට අයත් කියවීම් ශාලා 10 ක් ඇත) පුවත්පත් මිලදී ගෙන බෙදා හරින්නේ ද රාජගිරිය මධ්‍ය පුස්තකාලය මගිනි.

**අනුර යහම්පත්**

11 පිටුවට

විශේෂයෙන් ළමා පරපුර තුළ පොත් පත් කියවීමේ රුචිය වර්ධනය කරවීම හා ඒ තුළින් ඔවුන් මහජන පුස්තකාල වෙත යොමු කරවා ගැනීම අරමුණු කරගත් වැඩසටහන් රැසක් රාජගිරිය මධ්‍ය පුස්තකාලය ක්‍රියාවට නංවා ඇත. පාසල් හා දහම් පාසල් ආශ්‍රිතව කියවීමේ කඳවුරු පැවැත්වීම, දරුවන් වෙනුවෙන් පාසල් මට්ටමෙන් (විශේෂයෙන් ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන් සඳහා) පුස්තකාල සාමාජික ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම ඒ අතරින් කිහිපයකි.

මෙම වැඩසටහන්වලදී ඔවුන්ට පොත් පත් කියවීමේ වැදගත්කම, පුස්තකාල මගින් සැලසෙන සේවාව හා අපගේ පුස්තකාල සතු පොත් පත් පිළිබඳ අවබෝධයක් ලබා දී ඔවුන් වෙත පුස්තකාල සාමාජිකත්වය ලබා දීමට කටයුතු කෙරේ.




මේ හැරුණු විට සාහිත්‍ය මාසයේදී පාසල් දරුවන් අතර චිත්‍ර, ජන ගායනා, කථික, රචනා තරග ආදිය පවත්වා ඔවුන්ගේ හැකියාවන් අගය කිරීමට ද චිත්‍ර වැඩමුළු පවත්වා දරුවන් තුළ ඇති සෞන්දර්යාත්මක හැකියාවන් දියුණු තියුණු කරගැනීමට අවස්ථාව සලසා දීමට ද රාජගිරිය මධ්‍ය පුස්තකාලය පියවර ගෙන තිබේ.

අන් කවරදාටත් වඩා අද අපි ආර්ථික වශයෙන් හෙම්බත් වී සිටින්නෙමු. මේ තත්ත්වය හමුවේ අද මවුපියන්හට දරුවන් වෙනුවෙන් අමතර පොතක් පතක් මිලදී රැගෙන දීම ඉතාමත් අසීරු ය. මේ තත්ත්වයට යම් පිළියමක් යෙදීමට රාජගිරිය මධ්‍ය පුස්තකාලය අමතක නොකළේය.

මේ යටතේ රාජගිරිය මධ්‍ය පුස්තකාලයට අයත් 'විජය', 'විදුසර' යන පුවත්පත් පාඨකයින් කියවා සතියකට පසුව රාජගිරිය හේවාවිතාරණ ප්‍රාථමික විද්‍යාලයට ලබා දේ. සිසුන් ඒවා කියවූ පසු නැවත මධ්‍ය පුස්තකාලයට භාර දේ. මේ වැඩසටහන ඉතාමත් සාර්ථකව ක්‍රියාවට නැංවේ.

දරුවන් තුළ තරග විභාගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය දිරිමත් බව වර්ධනය කරවීමේ අරමුණෙන් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග හා අ.පො.ස. (සා.පෙ.) විභාග සම්මන්ත්‍රණ වාර්ෂිකව පැවැත්වීමට ද රාජගිරිය මධ්‍ය පුස්තකාලය පියවර ගෙන තිබේ.

වැඩිහිටි පාඨක ප්‍රමාණය ඉහළ නංවාලීමේ වැඩසටහනක් ද මෙම පුස්තකාලය මගින් ක්‍රියාත්මක වේ. ඒ අනුව රාජගිරිය වික්ටෝරියා නිවාසය, මොරගස්මුල්ල කියවීම් ශාලාව, ඔබේසේකරපුර පට්ඨාන විහාරය කේන්ද්‍ර කොටගෙන සෙනසුරාදා දිනවල දෙසතියකට වරක් ජංගම පුස්තකාල සේවාවක් පැවැත්වේ.

රාජගිරිය මධ්‍ය පුස්තකාලය යනු හුදෙක් දැනුම බෙදාහරින මධ්‍යස්ථානයක් පමණක්ම නොවන්නේය. ඊට හේතුව පාඨක සුබසාධනය සඳහා ඉවහල් වන වැඩසටහන් රැසක් ද ඒ මගින් ක්‍රියාවට නැංවීම ය.

'පොත් අපේ නෙත් වගේ - නෙත් රැකගෙන පොත් කියවමු' වැඩසටහන මේ අතරින් මූලික වේ. මෙහිදී වසරකට වරක් මධ්‍ය පුස්තකාල පාඨකයින්ගේ ඇස් පරීක්ෂා කර සහන මිලකට ඇස් කණ්ණාඩි ලබාදේ. මේ සඳහා දානපතියන්ගේ සහයෝගය ද නොඅඩුව ලැබේ.

පාඨකයින්ගේ පෝෂණය පිළිබඳවද සැලකිලිමත් වූ රාජගිරිය මධ්‍ය පුස්තකාලය ඔවුන් වෙනුවෙන් නොමිලේ කොළ කැඳ සහ සව් කැඳ ලබා දීමේ වැඩසටහනකට ද මුලපිරුවේය.

පාඨකයින් තුළ ආධ්‍යාත්මික සුවය වර්ධනය කරනුවස් ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා හා භාවනා වැඩසටහන් ද ක්‍රියාවට නැංවේ.

රාජගිරිය මධ්‍ය පුස්තකාලය වෙත ඔබ සතු වටිනා පොත් පත් පරිත්‍යාග කිරීමේ අවස්ථාව ද විවර කර තිබේ. ඔබ පරිහරණය කළ පොත් පත් පුස්තකාලයේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන භාරගැනීමට සූදානමින් පසු වේ.

කාලයේ තාලයට අනුව හැඩගැසෙමින් රාජගිරිය මධ්‍ය පුස්තකාලය එහි පාඨක පහසුව සඳහා නවීන තාක්ෂණයෙන් විපුල ඵල නෙළාගෙන තිබේ. ඒ, නව ඩිජිටල් සාමාජික කාඩ් පතක් මගින් ගනු දෙනු කිරීමට ඉඩ කඩ සලසා දෙමිනි. දැනුම බෙදාහැරීම, පාඨක සුවපහසුව, පාඨක සුබසාධනය කේන්ද්‍ර කරගත් රාජගිරිය මධ්‍ය පුස්තකාලය මේ වනවිට කෝට්ටේ

18 පිටුවට



# පරිසර ගැටලුවක් බවට පත්ව ඇති අපද්‍රව්‍ය නිර්මාණාත්මකව භාවිතය ගැන

## අපගෙන් ආදර්ශයක්

දිනපතාම ඔබගේ අපගේ නිවෙස්වල එක්රැස් වන අපද්‍රව්‍ය ප්‍රමාණය අප්‍රමාණ ය. මේවා එක්රැස් කර බැහැර කිරීමේ කාර්යය පැවරී ඇත්තේ පළාත් පාලන ආයතනවලටය. ඒ වෙනුවෙන් වැය වන්නේ ඔබගේ යහපත වෙනුවෙන් ඔබ විසින්ම ගෙ වනු ලබන බදු මුදල් ය.



අපද්‍රව්‍ය යනු අද තර්ජනාත්මක සෞඛ්‍ය ගැටලුවක් වන තරමට තත්ත්වය උග්‍ර වී තිබේ. ඒ වෙනුවට අපද්‍රව්‍ය සම්පතක් බවට පමුණුවාගත හැකි ක්‍රමවේදයන් කෙරෙහි උගතුන්ගේ අවධානය යොමු විය යුතුය.

මේ ගැටලුව වඩාත් ප්‍රබල වී ඇත්තේ විශේෂයෙන් දිරාපත් නොවන අපද්‍රව්‍ය සම්බන්ධයෙනි. නිදසුනක් ලෙස දැක්වුවහොත් ප්ලාස්ටික්වලින් නිපදවූ කෝප්ප, බෝතල්, බූලි ආදිය භාවිතයෙන් ඉවත් කෙරුණු කල නිසි පරිදි බැහැරලීමක් සිදුනොවූ විට ඒවා තුළ එක්රැස් වන වැසි ජලයේ මදුරුවන් බිත්තර හෙළීමෙන් ඩෙංගු රෝගය පැතිර යාමේ වැඩි ඉඩක් සැකසේ.

දිරාපත් වන අපද්‍රව්‍ය වුවද නිසි ලෙස බැහැරලීමක් සිදුනොවූ විට ඉහත ගැටළුව නිර්මාණය වේ. උදාහරණයක් ලෙස තැඹිලි කෝම්බවලට, පොල්කටුවලට පිරෙන වැසි ජලය ද මදුරු බිත්තර වර්ධනයට හොඳම ස්ථානයන්ය. මෙවැනි වූ අපද්‍රව්‍ය නිර්මාණාත්මක භාවිතයන් තුළින් නැවත භාවිතයට ගැණීම පිළිබඳ සුවිශේෂී වූ ආදර්ශයක් අප මහා නගර සභාවෙන්ම ඉදිරිපත් විය. ඒ, 2019 වසරේ දෙසැම්බර් 21 වැනි දින පැවැති ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ එවකට නගරාධිපතිවරයා වූ නීතිඥ මධුර විතානගේ මැතිතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාවට නැංවුණු 'මහා නගර සභා දින' වැඩසටහනේදීය. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයක් මුල් වී මෙවැනි වැඩසටහනක් ක්‍රියාවට නැංවුණු මුල්ම අවස්ථාව ලෙසින් ඉතිහාසයට එක්විය. මෙම වැඩසටහනේ අංගයක් ලෙසින් මහා නගර සභා කාර්ය මණ්ඩලයේ නිර්මාණාත්මක හැකියාවන් විදහා දැක්වුණු ප්‍රදර්ශනයක්ද පැවැත්විණි. මෙහිදී මහා නගර සභාවේ 'ආයතන අංශය' ප්‍රදර්ශන කුටිය වඩාත් කැපී පෙනිණි.

එමගින් ඔවුන් සමාජයට දුන් ආදර්ශය වූයේ දිරාපත් වන හා දිරාපත් නොවන අපද්‍රව්‍ය උපයෝගී කරගෙන වගා බඳුන් තනා ගෙවතු අලංකරණ වගාවන් සඳහා යොදා ගත හැකි බවය. ඉතාමත් ආදර්ශවත්, විචිත්‍රවත් ඉදිරිපත් කිරීමක් නිරූපණය කෙරුණු මේ ප්‍රදර්ශන කුටියට 'හොඳම ප්‍රදර්ශන කුටිය' ට හිමි ත්‍යාගය පිරිනැමිණි.

පුරවැසි ඔබත් මෙවන් වූ නිර්මාණාත්මක කුසලතාවන් කෙරෙහි යොමු වීමෙන් අපද්‍රව්‍ය බුද්ධිමත් ලෙසින් පරිහරණයට ගැනීමේත් එමගින් සුවදායක පරිසරයක් ගොඩනංවීමේත් කොටස්කරුවන් වනු නොඅනුමාන ය.

**නදුන්**

# කෝට්ටේ දියුණුවට

## පුරවැසි ඔබගේ සහයෝගය අත්‍යවශ්‍යයි





නගර සැලසුම්කරණය හා නගර නිර්මාණ කරණය මේ වන විට ඉතාමත් පුළුල් වූද ක්‍රමානුකූල වූද කාර්යයක් බවට පත්ව තිබේ. මේ කාර්යයේදී ඒ ප්‍රදේශවල පළාත් පාලන ආයතන වෙත පැවරී ඇත්තේ ඉතාමත් භාරදූර වගකීමකි.

වර්තමානයේදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රටේ පරිපාලන අගනුවර බවට පත්ව තිබේ. එය වඩාත් විචිත්‍ර-වත්, සෞඛ්‍යාරක්ෂිත පුරවරයක් බවට පත්කිරීමෙහිලා වූ වගකීමෙන් සැලකිය යුතු කොටසක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව වෙත පැවරී ඇත.

මේ කාර්යය ඉටුකිරීමෙහිලා මුදුන්පමුණුවා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් මෙලෙස සාරාංශගත කළ හැකිය.

- ඓතිහාසික පුරාවස්තු ආරක්ෂා කරගනිමින් කෝට්ටේ පැරණි ශ්‍රී විභූතිය ආරක්ෂා කර ගැනීම
- ස්වාභාවික සෞන්දර්යය ආරක්ෂා කර දීම හා සංවර්ධනය කිරීම
- බදු ගෙවන ජනතාවගේ මූලික අවශ්‍යතාවන් උපරිම මට්ටමින් ඉටුකිරීම
- උසස් මට්ටමේ මහජන සේවාවක් ලබාදීම
- මහජන සෞඛ්‍යාරක්ෂාව හා සනීපාරක්ෂාව උපරිම මට්ටමින් සලසා දීම
- ජනතාව සමග උසස් මට්ටමේ අන්තර් සම්බන්ධතාවක් පවත්වාගෙන යමින් උපරිම සේවයක් ඉටුකිරීම
- ආයතනික සංවර්ධනය මගින් උසස් ප්‍රතිඵල අත්කර දීම
- ආර්ථික සංවර්ධනය මගින් ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම
- කෝට්ටේ අගනගරය 'සුහුරු නගරයක්' (Smart City) බවට පත්කිරීම.

මෙම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා විවිධ වූ වැඩපිළිවෙළ හා ක්‍රමවේදයන් අප ආයතනය සතුව තිබේ. මෙහිලා නවීන තාක්ෂණික ක්‍රමෝපායයන්ගේ පිහිටාධාරය ද උපරිමව ලබාගැනීම අපගේ අපේක්ෂාවකි. ඉදිරියේදී අප ක්‍රියා-වට නැංවීමට බලාපොරොත්තු වන 'සුහුරු නගර සංකල්පය' (Smart city concept) මේ අතර වේ.

ශ්‍රී ජයවර්ධනපුරවරය විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන උගතුන්ගෙන් නොඅඩු නගරයකි. මේ පිරිස නගරයකට උරුම මිල කළ නොහැකි සම්පතකි. මොවුන් සතුව අප පුරවරයේ දියුණුව කෙසේ සිදුවිය යුතුද? යන කාරණාවට ඉතාමත් සාර්ථක පිළිතුරු තිබීමට පුළුවන. එවැනි අදහස් හා යෝජනා වෙතොත් ඒවා අප වෙත ඉදිරිපත් කරන මෙන් ඉතාමත් ගෞරවණීයව ඉල්ලා සිටින්නෙමු.

මන්ද ඔබගේ පුරවරය වඩාත් යහපත් වාසභූමියක් බවට පමුණුවාලීමෙහිලා බුද්ධිමත් ප්‍රජා දායකත්වය ඉතාමත් වැදගත් කොට සලකන බැවිනි.

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ කළමනාකරණ කමිටුව**

පශු වෛද්‍ය සායනය

# මාරාන්තික ජලභීතිකා රෝගය



ජලභීතිකා රෝගය හෙවත් පිස්සු බලු රෝගය යනු වසර 4000 කට වඩා පැරණි (ලෝකයේ පැරණිතම) වෛරස් රෝගය වේ. මෙය 100% ක්ම මාරාන්තික රෝග යකි. මෙම මාරාන්තික රෝගය නිවෙස්වල සුරතලයට ඇති කරන බල්ලා, බළලා ආදි සතුන්ටත් ගවයා, ඌරා, එළුවා වන කෘෂිකාර්මිකව වැදගත් වන සතුන්ටත් නරියා, මුගටියා, කලවැද්දා වැනි කැලෑ සතුන්ටත් වැළඳේ. පොදුවේ ගත් කල මිනිසා ඇතුළු සියලු ක්ෂීරපායී (කිරි බී වැඩෙන) සතුන්ට වැළඳෙන රෝගයකි.

මෙම වෛරසය ආසාදනය වීම නිසා ලොව පුරා වසරකට පුද්ගලයන් 59,000 ක් පමණ මිය යනු ඇත. එනම් සෑම මිනිත්තු 10 කට වරක්ම ලෝකයේ කොතැනක හෝ පුද්ගලයකු බැගින් මිය යයි. ශ්‍රී ලංකාවේද වසරකට පුද්ගලයන් 25 - 30 ක ප්‍රමාණයක් මිය යන අතර බහුලවම නොදැනුම්වත්කම හා නොසැලකිල්ල නිසා වෛද්‍ය උපදෙස්වලට යොමු නොවීමත් අවාසනාවන්ත තත්ත්වයට පත් වේ.

මෙම වෛරසය ආසාදනය වීමෙන් පසු රෝගය සුව කිරීම සඳහා කිසිදු සාර්ථක ක්‍රමයක් මේ දක්වා සොයා ගැනීමට අපොහොසත් වී ඇත. එනමුත් මෙම රෝගය වැළඳීම 100% වළක්වා ගැනීමට එන්නත්කරණය මගින් හැකියාව ලැබී ඇත. ලොව මුල්ම සාර්ථක එන්නත ලෙස ජලභීතිකාවට එරෙහි එන්නත 1895 දී ලුවී පාස්චර් නමැති ප්‍රංස ජාතිකයා විසින් සොයා ගන්නා ලදී.

ඒ අනුව වර්තමානයේ ජලභීතිකා රෝගය වැළැක්වීම සඳහා සතුන් වෙනුවෙන් පූර්ව එන්නත්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. ජලභීතිකාව වැළඳුණු සතකු විසින් සිදුකරනු ලබන සපා කෑමක් හෝ සිරීමක් මගින් සත්ත්වයාගේ ඛේඨයේ (කෙළවල) මිශ්‍ර වී ඇති වෛරසය ශරීරයේ ස්නායු පද්ධතියට ඇතුළු වීම සිදුවේ. ඉන් පසු මොළය තුළ වර්ධනය වන වෛරසය ශරීරයේ ක්‍රියාකාරීත්වය අඩාල කර මරණය කරා ළඟා කරවයි. එබැවින් ජලභීතිකා රෝගයෙන් වැළකී සිටීමට පහත සඳහන් ක්‍රියාවන් අනුගමනය කිරීම අනිවාර්ය වේ.

- **අපගේ නිවෙස්වල ඇති කරන සහ නිවෙස් ආශ්‍රිතව ජීවත් වන සියලු සුනඛයින් ජලභීතිකාවට එරෙහිව එන්නත් කිරීම.**
- **සැක සහිත ක්ෂීරපායි සතකුගේ සපා කෑමකට හෝ සිරීමකට ලක් වූ වහාම තුවාලය සබන් යොදා ගලා යන ජලයෙන් හොඳින් විනාඩි 05 ක් පමණ සේදීම.**
- **ඉන් පසු වහාම වෛද්‍ය උපදෙස් සඳහා ළඟම පිහිටි රජයේ රෝහලකට රැගෙන යාම.**
- **අවට පිරිසිදුව තබා ගැනීම හා සුනඛයින්ගේ හා බළලුන්ගේ අනවශ්‍ය පැටවුන් බෝ වීම වැළැක්වීමට කටයුතු කිරීම .**



උපදෙස්

කෝට්ටේ මහා නගර සභාවේ
ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි
රුවිනි එස්. පිඹුරගේ මහත්මිය

# නීතියයි ඔබයි

**නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවන්නේ යැයි කියමනක් තිබේ. එදිනෙදා ජීවිතයට බලපාන නීති පිළිබඳ අප අනිවාර්යයෙන්ම දැනුම්වත් විය යුතුමය. මේ ඒ වෙනුවෙන් වෙන් වූ විශේෂාංගයකි.**



## ඔප්පු ලිවීම

යම් නිශ්චල දේපළක අයිතිය හුවමාරු වීමේදී එම හුවමාරුව නීත්‍යනුකූල ලේඛනයන් මගින් අයිතිය තහවුරු වන ආකාරයට අනුගමනය කළ යුතු නීත්‍යනුකූල ක්‍රියාවලිය 'ඔප්පු ලිවීම' ලෙස හැඳින්විය හැකිය.

යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් ගත් විට එහි අයිතිය පැවරීමේදී ඔප්පුවක් මගින් එවැනි පැවරීමක් සිදුවන නමුත් මෝටර් රථ වැනි ඇතැම් චංචල දේපළ පැවරීමේදී ඒ පිළිබඳ අනුගමනය කළ යුතු විශේෂ නෛතික විධිවිධාන ඒ ඒ පනත් යටතේ දක්වා ඇත. එහෙත් එවැනි පැවරීම් නොතාරිස්වරයකුගේ විෂය පථයට අයත් වන්නේ නැත.

නිශ්චල දේපළ සම්බන්ධයෙන් ගත් විට ලේඛන ලියා-පදිංචි කිරීමේ ආඥා පනතේ සඳහන් විධිවිධානවලට අනුව මෙම පැවරීම සිදුකළ යුතු අතර නොතාරිස් ආඥා පනතේ සඳහන් විධිවිධාන පදනම් කරගනිමින් පැවරීම නීත්‍යනුකූල කිරීම සිදුවේ.

**ඉඩමක් මිලදී ගැනීමට පෙර එනම් යම් ඔප්පුවක් ලිවීමට පෙර එම ඉඩමේ හිමිකම් පරීක්ෂා කිරීම**

නොතාරිස් ආඥා පනතේ 31(17) වගන්තිය අනුව නොතාරිස්වරයකු විසින් ඔප්පු සහ ලේඛන ලියා සකස් කිරීමට පෙර එම ඉඩමේ හිමිකම් පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. හිමිකම් පරීක්ෂාවකින් අපේක්ෂිත කාර්යයන් වන්නේ එකී ඉඩම් අයිතිය අවසාන අයිතිකරුට අඛණ්ඩ නිර්බාධිත අයිතිය ක්‍රමානුකූලව ගලා ගොස් ඇත්ද තහවුරු කර ගැනීමත් එම දේපළ සඳහා වෙනත් නීතිමය බැඳීමක් හෝ වගකීමක් තිබේද (උකස් කර වැනි) යන්න පිළිබඳ පරීක්ෂා කිරීමත්ය.

සාමාන්‍යයෙන් දේපළක නිරවුල් අයිතිය ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 42 වගන්තිය අනුව සහ එහි විධිවිධානවලට යටත්ව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඇති පත්ඉරු/ඔප්පුවල දෙවැනි පිටපත් ආදී ලේඛන එම පුද්ගලයාට, ඔහුගේ නීතිඥවරයාට හෝ හෝ බලය ලත් තැනැත්තකුට පරීක්ෂා කිරීමේදී සහතික පිටපත් ගැනීමේ හැකියාව ඇත.

මෙම පරීක්ෂා කිරීමේදී මුල් ඉඩමේ සිට පරීක්ෂා කරන බිම් කොටස දක්වා ඉඩමේ අයිතිය හුවමාරු වීම සිදුවූ ආකාරය හරස් සටහන් සමග පත්ඉරු සටහන් සම්බන්ධ කර තිබේද පිළිබඳ පරීක්ෂා කළ යුතු අතර ආරම්භක අයිතිකරුගේ සිට වර්තමාන අයිතිකරු දක්වා අඛණ්ඩ අයිතිය ගලා යාමක් සිදුවී තිබේද යන්න පරීක්ෂා කර ඒ බවට නොතාරිස්වරයා සෑහීමට පත්විය යුතුය. අඩුම තරමින් වසර 30 කට ආසන්න කාලයක් මෙසේ පරීක්ෂාවන් සිදුකළ යුතුය.

මෙසේ ඉඩම් ලියාපදිංචි කිරීම් කාර්යාලයේ ලේඛන පරීක්ෂාවට අමතරව අදාළ පළාත් පාලන ආයතනයේද හිමිකම් පරීක්ෂාව සිදුකළ යුතු අතර මේ සඳහා මෙහි පහත සඳහන් ලේඛන පරීක්ෂා කළ යුතුවේ.

- **නොපරවා ගැනීමේ සහතිකය** (Non vesting certificate)
- **වීථි රේඛා සහතිකය** (Street line certificate)
- **පදිංචි වීමේ සහතිකය** (Certificate of conformity)
- **අයිතිය පරීක්ෂාව** (Certificate of ownership)



උපදෙස්
කෝට්ටේ මහා නගර සභාවේ
නීති නිලධාරි
නීතිඥ ඒ. එල්. අරුණි එස්. ගුණරත්න මහත්මිය




# කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවට අයත් ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක සේවය ආරම්භ වූයේ 2002 වර්ෂයේදී ය. ඒ, කෝට්ටේ කීර්තිමත් නගරාධිපතිවරයකු වූ නීතිඥ චන්ද්‍රා සිල්වා මැතිතුමාගේ සංකල්පයක් අනුව ය. ගිනි භට නිලධාරීන් 21 දෙනකුගෙන් සහ ගිනි නිවීම් රථ 9 කින් ඇරඹි මෙම ඒකකය වර්තමානයේ එනම් 2023 වර්ෂය වන විට ගිනි භට නිලධාරීන් 54 දෙනකුගෙන්, වාහන 8 කින් එනම් ගිනි නිවීම් රථ 3 ක්, ජල බවුසරයක්, දිගු කළ හැකි ඉනිමං සහිත මීටර 64 ක් සහ මීටර 18 ක් එසවිය හැකි **DTL** රථ 2 ක් (හයිඩ්‍රෝලික් ප්ලැට්ෆෝම්), මාර්ග අනතුරුවලදී ක්‍රියාත්මක කළ හැකි ආපදා රථයක්, ගිලන් රථයක් යන වාහනවලින් සමන්විත වේ.


ප්‍රධාන ස්ථාන භාර නිලධාරි එන්. ඩී ලියනගේ මහතා

ගිනි නිවීම් ඒකකයේ වර්තමාන නිලධාරී මණ්ඩලය ලෙස අවුරුදු 22 ක පමණ පළපුරුද්දක් ඇති මූලික ගිනි භට නිලධාරීන් තිදෙනෙක් සිටින අතර ඔවුන් ස්ථාන භාර නිලධාරීන් ලෙස ද හැඳින්වේ. තවද පළමු පෙළ නිලධාරීන් කිහිප දෙනෙක් ද මෙයට අයත් වේ.

ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය අංශ තුනකින් සමන්විත වේ. ඒවා නම්,

- ගිනි නිවාරණ අංශය (Prevention Unit)
- ගිනි නිවීම් පුහුණු අංශය (Trainning Unit)
- මෙහෙයුම් අංශය (Operation Unit)

**ගිනි නිවාරණ අංශය**

ගිනි නිවාරණ අංශයේ කාර්යය වන්නේ ගොඩනැගිලි ඉදිකිරීමේදී එම ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර ලබාගත යුතු ගිනි නිවාරණ සහතිකය නිකුත් කිරීම ය. වර්ග මීටර 400 කට වැඩි නිවසක් වුවද මෙම සහතිකය ලබාගත යුතුය. සියලුම බහුකාර්ය ගොඩනැගිලි ද ගිනි නිවාරණ සහතිකය ලබාගත යුතුය.

මහල් 10 කට වඩා උස් ගොඩනැගිලි **(High rising buildings)** අවදානම අධික ගොඩනැගිලි බැවින් ගිනි නිවාරණ සහතික ලබාදීමේදී ඒ සමගම අවදානම අඩු කිරීම සඳහා ගොඩනැගිල්ල තුළදීම ගිනි නිවාගත හැකි පහසුකම් ද සලසා දෙනු ලැබේ.

**ගිනි නිවීම් පුහුණු අංශය**

ගිනි නිවීම් පුහුණු අංශය මගින් කෙරෙනුයේ පාසල් දරුවන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි කාර්ය මණ්ඩල, ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකයේ ගිනි භට නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා

17 පිටුවට

තිළිණ සම්පත්




නවීන තාක්ෂණික පහසුකම් සහිත ගිණි නිවීම් රථ 2 ක් ලැබුණු දා.

ගිනි නිවීම් පිළිබඳ සහ අනෙකුත් ගිනි නිවාරණයන් පිළිබඳ දැනුම වර්ධනය කරවීම ය.

**මෙහෙයුම් අංශය**

මෙහෙයුම් අංශය ගිනි නිවීම් ඒකකයේ හදවත බඳු ය. ගිනි නිවීම, ගින්නෙන් ජීවිත (මිනිසුන් හා සතුන්) හා දේපළ රැකගැනීම, පරිසරය ආරක්ෂා කිරීම, ළඳු කැලෑ ගින්නෙන් බේරා ගැනීම, රසායනික ද්‍රව්‍ය කාන්දු වීමෙන් සිදුවන හානිය වළක්වාගැනීම වැනි කාර්යයන් රැසක් මෙහෙයුම් අංශය මගින් සිදුකෙරේ.

මෙහෙයුම් අංශයේ පළපුරුදු නිලධාරීන් 10 ක් පමණ සිටින අතර අනෙක් ගිනි භට නිලධාරීන් 30 දෙනාට ද වසර 10 ක පමණ අත්දැකීම් තිබේ. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකයේ ශාරීරික හා මානසික වශයෙන් නිරෝගී කාර්ය මණ්ඩලයක් වේ. කෝට්ටේ නගරය තුළ ඇති විය හැකි ඕනෑම ගින්නක් පාලනය කිරීමට තරම් මෙම කණ්ඩායම ජවසම්පන්න ය.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකයේ නිලධාරීන්හට කොළඹ ගිනි නිවීම් දෙපාර්තමේන්තුවට අයත් වැල්ලවත්ත පුහුණු පාසලෙන් සහ පිටස්තර පුහුණු නිලධාරීන් ලවා දේශන හා වැඩමුළු පැවැත්වීමෙන් මූලික පුහුණුව ලබා දේ. ආපදා කළමනාකරණ ඒකකය මගින් ද පුහුණු වැඩසටහන් පැවැත්වේ.

ගොඩනැගිලි කඩා වැටුණු විට ජීවිත බේරා ගන්නා ආකාරය පිළිබඳ පුත්තලම ගඟේවාඩිය ප්‍රදේශයේදී පුහුණු වීම් ලබා දී ඇත. කොළඹ ජාතික රෝහලේ **EMT (Emergency Medical Technician)** අංශය මගින් මාස 3 ක පුහුණුව ලැබූ නිලධාරීන් සිටින අතර ප්‍රථමාධාර පුහුණුව සාන්ත ජෝන් ගිලන් රථ හමුදාවෙන් ලැබේ. ජලයේදී ජීවිත බේරා ගන්නා ආකාරය පිළිබඳ ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමයේ පුහුණුව ලැබූ නිලධාරීහු ද කඹ ආධාරයෙන් ජීවිත බේරා ගන්නා ආකාරය පිළිබඳ පුහුණුව ලැබූ නිලධාරීහු ද මෙම ඒකකයේ සේවය කරති. කාර්යක්ෂම, ක්‍රියාශීලී මානසික හා ශාරීරික වශයෙන් ශක්තිමත් කණ්ඩායමක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය සතු වේ. දියුණු විදේශ රටවලින් පුහුණුවක් ද ලබා දීමට සුදුසු වැඩපිළිවෙළක් සැකසුවහොත් මෙම කණ්ඩායම ජාත්‍යන්තර මට්ටම දක්වා යාමට වුව සුදුසු මට්ටමක පවතී.

කෝට්ටේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ මෙම සේවාව නොමිලේ සැපයේ. මෙම ප්‍රදේශයේ පිහිටි ඕනෑම ව්‍යාපාරික ආයතනයක්, පෞද්ගලික ආයතනයක්, රාජ්‍ය ආයතනයක්, පෞද්ගලික නිවාස, පාසල්, ආගමික ස්ථාන වැනි ඕනෑම ස්ථානයක ගින්නක් ඇති වී ජීවිත අවදානමක් ඇති බව මෙම අංශයට දැනුම් දීමෙන් අප ඒකකය එම සේවාව ලබා දේ. එම දුරකතන අංකයන් මෙසේ ය.

**0112879444 (හදිසි ඇමතුම් අංකය)**

**0112879443 (කාර්යාල අංකය)**

**0112889844 (ක්ෂණික ඇමතුම් අංකය** Hotline)

හෝමාගම, කඩුවෙල, මහරගම, කොටිකාවත්ත හා අවිස්සාවේල්ල පළාත් පාලන ආයතන සමග ගිවිසුම්ගත වී ඒ ප්‍රදේශවල ද ගිනි නිවීම් කටයුතු කිරීමට මෙම ඒකකය බැඳී සිටියි. ඒ වෙනුවෙන් මෙකී ප්‍රදේශවල පළාත් පාලන ආයතනයන් විසින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව වෙත ගෙවීමක් කරනු ලැබේ.

18 පිටුවට

17 වැනි පිටුවෙන්... පැය විසිහතර පුරා...

නුගේගොඩ නෝලිමිට් ආයතනයේ ත්‍රස්තවාදීන් විසින් අටවා තිබූ බෝම්බයක් පිපිරුණු අවස්ථාවේ ද අප ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය ජීවිත කිහිපයක් ද බේරාගෙන තිබේ. ත්‍රස්තවාදී යුද සමයේදී යුද බිමේදී තුවාල ලද හමුදා සාමාජිකයින් රත්මලාන ගුවන්තොටුපොළේ සිට කළුබෝවිල, ජයවර්ධනපුර, රාගම රෝහල්වලටත් කොළඹ යුද හමුදා රෝහලටත් මෙම ඒකකය සිය ගිලන් රථ මගින් රැගෙන ගොස් තිබේ. පැලවත්ත කූල් ප්ලැනට් ආතනයයේ ඇති වූ ගින්න නිවීමට ද මොවුහු සක්‍රියව දායක වූහ. කඩුවෙල ඔරුවල ප්‍රදේශයේ කසළ ගෙනැවිත් දමන ස්ථානයක ඇති වූ ගින්න නිවීමට මොවුන් දින හතරක් වෙහෙස වූ අතර එය ඉතා අම්හිරි අත්දැකීමක් වූ බව එයට එක්වූවෝ පවසති. එසේ වුවත් එය විශාල පරිසර හානියක් වළක්වා ගැනීමට දායක වූ අවස්ථාවක් ලෙස සලකා ඔවුහු තෘප්තිමත් වෙති.

මහජනතාවගේ විවේචනයට නිතර ලක් වන සේවාවක් ලෙස ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය හැඳින්වීමට පුළුවන. ගිනි නිවීමට පැමිණීමට ප්‍රමාද වීම මොවුන්ට එල්ල වන ප්‍රධාන දෝෂාරෝපණයකි. මේ ප්‍රමාදයට බලපාන එක් හේතුවක් වන්නේ අධික මාර්ග තදබදයයි. සාමාන්‍යයෙන් ගිනි නිවීම් රථවලට මාර්ග තදබදයන් හමුවේ විරුද්ධ ධාවන පථයේ ද ගමන් කළ හැකි ය. එසේ වුවද එවන් කලබලකාරී අවස්ථාවකදී අනතුරක් සිදුවුවහොත් නීතියෙන් නම් කිසිසේත්ම සමාවක් ලැබෙන්නේ නැත.

තවද ගින්නක් පාලනය කිරීමට යෑමේදී රැගෙන යන ජල ප්‍රමාණය අවසන් වුවහොත් නැවත (මාර්ගවල සවි කර ඇති හදිසි ගිනි ගැනීම්වලදී ප්‍රයෝජනයට ගත හැකි 'ගිනි දිය මුව' හෙවත් **Hydrant** නොමැති ස්ථානවලදී) ළඟම පිහිටි ගංගා, වැව් ආදියෙන් ජලය රැගෙන ඒමට යම් කාලයක් ගත වේ. මේ කාලය තුළ ගින්න නැවත පැතිරී යාමට වුව ඉඩ ඇත. එවිට ද ජනතාව දොස් නඟනුයේ ගිනි නිවීම් සේවයට ය.

ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක සේවාව යනු දිවි පරදුවට තබා, ජීවිත අවදානම නොතකා නිරත වන රාජකාරියකි. සමාජ මෙහෙවරකි. මහජනතාව කළ යුත්තේ මෙම සේවාවට දොස් නැඟීම නොව එය අගය කිරීම ය. එයට තම උපරිම සහයෝගය දැක්වීම ය. (විශේෂ ස්තුතිය - ප්‍රධාන ස්ථාන භාර නිලධාරී එන්. ඩී. ලියනගේ මහතාට)




11 වැනි පිටුවෙන්...

## රාජගිරිය මධ්‍ය පුස්තකාලය

මහා නගර සභාවට අයත් පුස්තකාල සියල්ලම පාහේ ස්වයංක්‍රියකරණය කර ඇත.

දැනුම බෙදාහැරීම, පාඨක සුවපහසුව, පාඨක සුබසාධනය කේන්ද්‍ර කර ගත් රාජගිරිය මධ්‍ය පුස්තකාලයේ සුහද, මිත්‍රශීලී සේවය ලබාගැනුමට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව ඔබහට ගෞරවණීයව ඇරයුම් කරන්නෙමු.

සිකුරාදා, පෝය හා ප්‍රසිද්ධ නිවාඩු දින හැරුණු විට අනෙක් දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 5.00 දක්වා මෙම පුස්තකාලය ඔබ වෙනුවෙන් විවෘතව ඇත.

ශ්‍රී පුර

**E MAGAZINE පළ කෙරෙනුයේ කෝට්ටේ පුරවැසි ඔබ වෙනුවෙනි.**

**ඔබගේ අදහස්, යෝජනා ද අපට ලියා එවන්න**

Email:kmcmediaunit3@gmail.com

ශ්‍රී පුර පුවත්

## කෝට්ටේ ජනාධිපති විද්‍යාලයේ ඉංග්‍රීසි සාහිත්‍ය දින ප්‍රදර්ශනය දා



කෝට්ටේ ජනාධිපති විද්‍යාලයීය ඉංග්‍රීසි සාහිත්‍ය සංගමය මගින් සංවිධානය කරන ලද ශිෂ්‍ය නිර්මාණ ප්‍රදර්ශනයක් 2023 සැප්තැම්බර් 22 වැනිදා එම විද්‍යාලයේදී පැවැත්විණි. 6 වැනි ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිවල සිසුන්ගේ නිර්මාණ මේ සඳහා ඉදිරිපත් කර තිබිණි.

ඉංග්‍රීසි භාෂා පෙළපොත්වල පාඩම්වලට අදාළ වන පරිද්දෙන් නිර්මාණය කරන ලද අත්කම් නිර්මාණ, පොත් පත්, පෝස්ටර්, වගු ආදිය මෙහිදී ප්‍රදර්ශනය කෙරිණි.

## අගනගරයට හරිත වර්ණයක්



කෝට්ටේ අග නගරය ගස් කොළන්වලින් සපිරි හරිත නගරයක් කිරීමේ කටයුත්තකට පසුගියදා මුලපිරිණි. ඒ, කෝට්ටේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හා කොළඹ දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ මැතිතුමාගේ මූලිකත්වය හා මගපෙන්වීම ඇතිවය.

මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහයෝගය ලැබේ. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ නගර අලංකරණ ඒකකය මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පුළුල් වැඩ කොටසක් ඉටුකරයි. මෙහි පළමුවැනි අදියර යටතේ ගස් දහසක් රෝපණය කිරීමට නියමිතය.

මෙහි ආරම්භක පියවර යටතේ රාජගිරිය ගුවන් පාලම හා වැලිකඩ ප්ලාසා ගොඩනැගිල්ල අතර ගස් රෝපණය කෙරිණි.

## මහා නගර සභා කාර්ය මණ්ඩලය වෙනුවෙන් වෛද්‍ය සායනයක්



ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ සේවයේ නිරත වන සේවක මහත්ම මහත්මීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා වූ සෞඛ්‍ය සායනයක් 2023 සැප්තැම්බර් 21 වැනි දින මහා නගර සභා පරිශ්‍රයේදී පැවැත්විණි. මෙය නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කෙරුණු අතර සොඳුරු සුවසෙත් පදනම මගින් අනුග්‍රහය දැක්වීය.

## 5 ශිෂ්‍යත්ව දරුවන්ට නොමිලේ සම්මන්ත්‍රණයක්

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මහජන පුස්තකාල මගින් සංවිධානය කෙරුණු මේ වසරේ 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්වයට පෙනී සිටි සිසු දරු දැරියන් වෙනුවෙන් වූ සම්මන්ත්‍රණයක් 2023-10-10 වැනි දින මහා නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

වාර්ෂිකව නොමිලයේ සංවිධානය කෙරෙන මෙම සම්මන්ත්‍රණය මෙහෙයවන ලද්දේ ප්‍රවීණ ශිෂ්‍යත්ව ගුරුවරයකු වන චින්තක රන්මිණි මහතා විසිනි.

## ස්මාරක සංරක්ෂණයට ගිනි නිවීම් ඒකකයේ සහයෝගය



මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ක්‍රියාවට නැංවෙන සීගිරි ව්‍යාපෘතිය යටතේ පුරාවිද්‍යා ස්මාරකයන් අනාගත පරපුර උදෙසා ආරක්ෂා කිරීමේ 'ස්මාරක සංරක්ෂණය' ව්‍යාපෘතියට මේ වන විට විවිධ ආයතන මගින් පුළුල් සහයෝගයක් ලැබේ.

ඒ යටතේ පසුගියදා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකයේ සාමාජිකයින් 20 දෙනකු පමණ මේ සඳහා සහය පළකිරීමට එක්වූහ.

## ඩෙංගු කීට පරීක්ෂාවන් හා ආහාර සුරක්ෂිතතාව සොයා බැලෙන වැටලීම් මාලාවක්

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කෝට්ටේ මහා නගර සභා සීමාව තුළ, 2023 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කළ ඩෙංගු කීට පරීක්ෂාවන් මගින් වරදකරුවන් බවට පත්වූවන්ට එරෙහිව නඩු 84 ක් පවරා තිබේ.

තවද කෝට්ටේ මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි ආහාර අළෙවි කරනු ලබන හා සිල්ලර අළෙවි සල් වැටලීම්වලදී ජනතා පරිභරණයට නුසුදුසු ආහාර හා භාණ්ඩ අළෙවි කළ ස්ථාන 12 කට එරෙහිව නඩු පවරා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ශාලිකා එස්. රණවීර මහත්මියගේ උපදෙස් පරිදි මහා නගර සභා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක මාලින්ද ජයවර්ධන මහතා ප්‍රමුඛ කණ්ඩායමක් විසින් මේ වැටලීම් සිදුකර ඇත.

## කෝට්ටේ ප්‍රදේශය සංවර්ධනය වෙනුවෙන් පියවර කිහිපයක්

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරන ලද එම කොට්ඨාසයට අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් එහි සභාපති කොළඹ දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023 සැප්තැම්බර් 27 වැනි දින ඇතුල්කෝට්ටේ නිපොන් මාවත අසල පිහිටි, නාගරික සංවර්ධන අධිකාරියට අයත් රැම්පාට් තෙත් බිම් උද්‍යාන පරිශ්‍රයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

කෝට්ටේ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු පිළිබඳ පුළුල්ව සාකච්ඡා කෙරුණු මෙම රැස්වීමේදී ප්‍රදේශය තුළ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත යුතු පියවරයන්, ඉහළ යන විදුලි ගාස්තු ගැටලුව අවම කරගැනීම සඳහා විකල්පයක් ලෙස සූර්ය කෝෂ භාවිතය, ඔබේසේකරපුර මාර්ගයේ වාහන ධාවනයට අවහිර වන පරිදි මාර්ගය දෙපස වාහන නතර කර තැබීම හා අනවසර වෙළෙඳාම නතර කිරීම යනාදී කාරණා සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා කෙරිණි.

ශ්‍රී ජයවර්ධනපුර කෝටටේ ප්‍රාදේශීය ලේකම් කසුන් ඇපා සෙනෙවිරත්න මහතාගේ සංවිධායකත්වයෙන් පැවැති මෙම රැස්වීමට කෝට්ටේ මහා නගර සභාව නියෝජනය කරමින් නාගරික ඉංජිනේරු ජේ. තිවහාර් මහතා, නාගරික ඉංජිනේරු ඩබ්ලිව්. ඒ. එස්. දමයන්ති මහත්මිය, සහකාර නාගරික ඉංජිනේරු අජිත් හෙට්ටිආරච්චි මහතා, ගිනි නිවන හා ජීවිතාරක්ෂක ඒකකයේ ප්‍රධාන ස්ථාන භාර නිලධාරී එන්. ඩී. ලියනගේ මහතා, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක මාලින්ද ජයවර්ධන මහතා, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, පුනර්ජනනීය බලශක්ති අධිකාරිය, සංචාරක මණ්ඩලය, විදුලි බල මණ්ඩලය, විදුලි බල (පුද්ගලික) සමාගම, මිරිහාන හා වැලිකඩ පොලිස් ස්ථාන යන ආයතනයන්හි නියෝජිතයන්, කෝට්ටේ ප්‍රදේශයේ සංවර්ධන නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන් එක් වූහ.

## ආපන ශාලා හිමියන් දැනුම්වත් කිරීමේ වැඩමුළුව

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ආපන ශාලාවල හිමිකරුවන් දැනුම්වත් කිරීමේ වැඩමුළුවක් 2023-10-17 වැනි දින මහා නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

ඉහත බල ප්‍රදේශ තුළ පිහිටි ආපන ශාලා සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම සම්බන්ධව අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම වැඩමුළුව පැවැත්වීමේ අරමුණ විය.

මෙය මහා නගර සභා නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කෙරිණි. මෙහිදී ජ්‍යෙෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂක (මහරගම) වජිර දසනායක මහතා හා නුගේගොඩ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී ඉනෝකා ලියනගේ මහත්මිය දැනුම්වත් කිරීමේ දේශන පැවැත්වූහ.

## ඔබේ සුවසෙතට අපෙන් අත්වැලක්

**0112 288 097**

සෞඛ්‍යසම්පන්න පුරවැසි ප්‍රජාවක් බිහිකිරීමේ අරමුණෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන සෞඛ්‍ය සායන මාලාවක් නොමිලේ පැවැත්වේ.

මොරගස්මුල්ල, බණ්ඩාරනායකපුර, ඔබේසේකරපුර, අංගම්පිටිය, නාවල, පිටකෝට්ටේ, දෙල්කඳ, පාගොඩ හා උඩහමුල්ල යන ස්ථානවලදී දන්ත සායන, මාතෘ සායන, සෞඛ්‍ය සායන, සුවනාරි හා ළමා සායන පැවැත්වේ

ඉහත සඳහන් නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දුරකථන අංකය ඇමතීමෙන් මෙම සායන පැවැත්වෙන දිනයන් හා වේලාවන් පිළිබඳ වැඩි දුර විස්තර දැනගැනීමට පුළුවන.

## මහා නගර සභාවේ මාසික ධර්ම දේශනාව

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ බෞද්ධ සංගමය මාසිකව සංවිධානය කරනු ලබන ධර්ම දේශනාව 2023 ඔක්තෝබර් 26 වැනි දින මහා නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

රාජගිරිය සුධර්මාරාම පුරාණ විහාරවාසී කාව්‍ය ශ්‍රී පූජ්‍ය පනාකඩුවේ සිරිවිමල ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් මෙම ධර්ම දේශනාව පවත්වනු ලැබිණි.




| ක්‍රීඩාංගනය | දිනකට අයකරන මුදල | VAT 15% | තැන්පතු මුදල |
|---|---|---|---|
| අංගම්පිටිය ක්‍රීඩා: | 25,000/= | 3750/= | 10,000/= |
| ● ජනක රණවක ක්‍රීඩා: | 25,000/= | 3750/= | 10,000/= |
| ● චන්ද්‍රා සිල්වා ක්‍රීඩා: | 20,000/= | 3000/= | 10,000/= |
| ● සේනානායක ක්‍රීඩා: | 10,000/= | 1500/= | 5,000/= |
| ● බණ්ඩාරනායකපුර ක්‍රීඩා: | 10,000/= | 1500/= | 5,000/= |
| ● දියවන්නා ක්‍රීඩා: | 4,000/= | 600/= | 3,000/= |

1. සියලු ක්‍රීඩා පිටි පෙ.ව.8.00 සිට ප.ව.5.00 දක්වා පමණි.
2. අංගම්පිටිය ක්‍රීඩා පිටිය සතියේ දින 7 ම වෙන්කරවා ගත හැකිය.
3. ජනක රණවක ක්‍රීඩා පිටිය ක්‍රිකට් තරඟ සඳහා වෙන්කරවා ගත නොහැකිය.
4. අපගේ සියලුම ක්‍රීඩා පිටිවල සැණකෙළි හා සංගීත ප්‍රසංග පැවැත්වීමට අවසර ලබා නොදෙන්.
5. රතු සලකුණු යොදා ඇති ක්‍රීඩා පිටි පොහොය හා ඉරිදා දිනවල වෙන් කරනු නොලැබේ.

**විමසීම් : 011 2 874 701**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**




| ඔබේසේකරපුර හා බණ්ඩාරනායකපුර උත්සව ශාලාවන් | දිනකට අයකරන මුදල | VAT 15% | තැන්පතු මුදල | ලබා දෙන වේලාවන් |
|---|---|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වැසියන් සඳහා | | | | පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා |
| ඉහළ මාලය | 7,500/= | 1125/= | 5,000/= | |
| පහළ මාලය | 6,000/= | 900/= | 5,000/= | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නොවන වැසියන් සඳහා | | | | ප.ව. 4.00 සිට රාත්‍රී 10.00 දක්වා |
| ඉහළ මාලය | 12,500/= | 1875/= | 10,000/= | |
| පහළ මාලය | 10,000/= | 1500/= | 10,000/= | |
| ආනන්ද සමරකෝන් එළිමහන් රංග පීඨය : නුගේගොඩ | 36,500/= | 5,475/= | 5000/= | |

වැඩි විස්තර සඳහා

**විමසීම් : 011 2 874 701**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**

**ඉඩකඩ ඇති තරමින් ඔබත් ගෙවතු වගාවක් ඇරඹුවහොත් ඉන් ලැබෙන වාසි, ප්‍රයෝජන බොහෝය. මේ, ඒ වෙනුවෙන් ඔබ යොමු කරවීමට කැප වූ ලිපි පෙළක ආරම්භක පියවරයි.**

# අපේ ගෙවත්ත



## ගෙවතු වගාවෙන් ලැබෙන වාසි

අනාදිමත් කාලයක සිට මිනිසුන් තමන්ගේ නිවෙස් අවට එළවළු, පළතුරු, කුළුබඩු, ඖෂධීය පැළෑටි, මල් සහ දැව ආදී ප්‍රයෝජනවත් හා අලංකාරවත් ශාක වගා කොට පරිසරය පිරිසිදුව හා අලංකාරව තබාගැනිමට ඉමහත් කැමැත්තක් දැක්වීය. නිවෙස් අවට භූමියේ ප්‍රයෝජනවත් සහ අලංකාරවත් ශාක වගා කිරීම 'ගෙවතු වගාව' වශයෙන් හැඳින්වේ.

ගෙවතු වගාවකින් අපට ප්‍රයෝජන රැසක් හිමි වේ. මේ ඉන් කිහිපයකි.

- පවුලේ සාමාජිකයන්හට ප්‍රියජනක සමබර ආහාර වේලක් සකත් කර ගත හැකි වේ.
- භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වේ.
- නිවසේ හා ගෙවත්තේ අපද්‍රව්‍ය නැවත නැවත භාවිත කිරීමට හැකි වීම නිසා ගෙවත්තේ පස සාරවත් වන අතර පරිසරය පිරිසිදු වේ.
- අවශ්‍ය විටදී අස්වනු නෙළාගෙන පරිභරණයට ගත හැකි වේ.
- ශාක නිසා අවට සිසිල් සුවපහසු අලංකාර පරිසරයක් නිර්මාණය වේ.
- වැඩිපුර ඵලදාව අළෙවි කිරීමෙන් අමතර ආදායමක් උපයා ගත හැකි වේ.
- විස විසෙන් තොර, රස, ගුණ පිරි, පිරිසිදු, ආරක්ෂාකාරී, අලුත් එළවළු හා පළතුරු පරිභෝජනයට ගත හැකි වේ.
- පවුලේ සැමට තම තමන්ගේ විවේක කාලය නිවසේ සිටම ප්‍රයෝජනවත් ලෙසින් ගත කිරීමට අවස්ථාව සැලසේ.
- වෙළෙඳ පොළෙන් භාණ්ඩ මිල දී ගැනීමට සිදුවන අවස්ථා අවම වීමෙන් ආර්ථික වාසියක් හිමි වේ.
- ගතට ව්‍යායාමයක්ද සිතට සතුටක්ද ලැබේ.

"ගෙවතු වගාව කරන එක නම් හොඳයි තමයි. ඒත් කෝ අපිට ඕව කරන්න ඉඩ කඩ?" මේ බොහෝ දෙනකු නඟන මැසිවිල්ලකි.

එහෙත් ඒ ගැටලුවටද මේ වන විට සාර්ථක විසඳුම් ලැබී තිබේ. 'බඳුන්ගත වගාව' මෙයට එක් පිළියමකි. ඉවත ලන ප්ලාස්ටික් බෝතල්, ප්ලාස්ටික් ගැලුම්වල පැළ සිටුවා තාප්පවල, ගස්වල එල්ලා තැබීමේ සාර්ථක ක්‍රමවේදයන් මේ නව විට කෘෂි තාක්ෂණික නිලධාරීන් විසින් හඳුන්වා දෙනු ලැබ තිබේ. මේ ක්‍රමවේදයක් උපයෝගී කොටගෙන අද මහල් නිවාසවල සාර්ථක වගා ව්‍යාපෘතීන් පවත්වාගෙන යනු ලැබේ.

මෙබඳු ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් අද ඉමහත් පාරිසරික ගැටලුවක් බවට පත්ව ඇති දිරාපත් නොවන අපද්‍රව්‍ය බැහැරලීමේ ගැටලුවටද සාර්ථක විසඳුම් ලැබී තිබේ.

ඉතින් ඔබත් ඉහත කී වාසි අත්පත් කරගැනීමට බලාපොරොත්තු වන්නේ නම් අදම ගෙවතු වගාවට යොමු වීම කෙරෙහි සිතා බැලීම ඉතාමත් වැදගත් වනු ඇත. ඒ සඳහා උපදෙස් සපයන ලිපි මාලාවක් ලෙස මේ විශේෂාංගය මේ සඟරාව ඔස්සේ ඔබට දිගින් දිගටම ඉදිරිපත් කිරීම අපගේ බලාපොරොත්තුව වන්නේය.

ගෙවතු වගාව ක්‍රමවත්ව පවත්වාගෙන යාම සම්බන්ධව තොරතුරු සමගින් මීළඟ සඟරාවෙන් ඔබ හමුවන්නෙමු.

**(ලිපි මාලාව සඳහා තොරතුරු සම්පාදනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත 'ගෙවතු වගාව' සඟරාව ඇසුරිනි.)**

සුවසෙත

# මින්පසු ඔබත් පොල් වතුර වීසි කරනවාද?



පොල් අපට නැතිවම බැරි සම්පතකි. පොල් ගෙඩියක් බිඳීමෙන් පසු පොල් වතුරට ඔබ කරන්නේ කුමක්ද? බොහෝ දෙනකු කරන්නේ ඉවත දැමීම ය. එහෙත් පොල් වතුරේ ගුණය දන්නේ නම් එම අනුවණ ක්‍රියාව කිසිදා නොකරනු නොඅනුමාන ය.

ලෝක සෞඛ්‍ය සංවිධානය නිකුත් කර ඇති අලුත්ම වාර්තාවකින් කියවෙන්නේ ලොව ශක්තිජනක පානයන් අතරින් පොල් වතුර අංක එකේ පවතින බව ය.

පොල් වතුරවල කැල්සියම්, පොටෑසියම්, මැග්නීසියම්, සෙලේනියම්, අයඩීන්, සල්ෆර්, විටමින් බී, සී, ඩී, ඇමයිනෝ අම්ල, කාබනික අම්ල, ශාක හෝර්මෝන ආදී ශාරීරික පැවැත්මට අත්‍යවශ්‍ය සංඝටක රැසක් අඩංගු වේ.

**පොල් වතුර සතු ගුණාංග රාශියෙන් කිහිපයක් මෙසේය.**

- රුධිරයේ අධික සීනි මට්ටම පාලනය කරයි. එමගින් දියවැඩියාව ඇතිවීමේ අවදානම අඩු වේ.
- වකුගඩුවල 'ගල්' ඇති වීම අවම කරයි.
- රුධිර සංසරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කරවයි.
- ආහාර දිරවීම පහසු කරයි.
- මස්පිඩු හා අස්ථි ශක්තිමත් කරයි.
- රුධිර නාළ තුළ ලේ කැටිගැසීම අවම කර රුධිර පීඩනය අඩු කරයි.
- ලෙඩ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව හෙවත් ප්‍රතිශක්තිකරණය ඉහළ නංවයි.
- පැපොල, සරම්ප, පළු දැමීම, බිබිලි හටගැනීම අවම කරයි.
- මලබද්ධය දුරු කරයි.
- මානසික පීඩනය, විශාදය, අම්ලපිත්ත රෝගය (ගැස්ට්‍රයිටීස්) පිළිකා, උදරාබාධ, පණු රෝග ආදියට ගුණදායක ය.
- සමේ රෝග ඇතිවීම වළක්වා සමට නිරෝගී බවක් ලබාදෙයි.
- කුරුලෑවලට ප්‍රතිකාරයකි.

**මෙබඳු වූ ශාරීරික හා මානසික අපහසුතා රැසකට පොල් වතුර හොඳ ඔසුවකි. ඉතින්, පොල් වතුරවල ගුණ යම් තරමකින් හෝ තේරුම් ගත් ඔබ අද පටන් පොල් වතුර වීසිකරනවාද?**

සුනෙත් ජයකොඩි (අන්තර්ජාලය ඇසුරිනි)

## කවරයේ කතාව

# කෝට්ටේ දරුවන්ගේ කලා කුසලතාවන් ඇගයෙන "පැහැසරණිය" සාහිත්‍ය උළෙල

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව මගින් පාලනය වන රාජගිරිය මධ්‍ය පුස්තකාලය, නුගේගොඩ, උඩහමුල්ල, බැද්දගාන මහජන පුස්තකාල හා ජංගම පුස්තකාල සේවා සාමාජිකත්වය හිමි සාමාජික සාමාජිකාවන් අතර සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් චිත්‍ර, ජන ගායනා, ගද්‍ය රචනා, පද්‍ය රචනා, අත් අකුරු, කෙටි කතා, කථික යන අංශවලින් පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික, කනිෂ්ඨ, ජ්‍යේෂ්ඨ, ජ්‍යේෂ්ඨ ද්විතීක හා විවෘත යන කාණ්ඩයන්ගෙන් පැවැත්වූ සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් උදෙසා ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කිරීම වෙනුවෙන් සංවිධානය කෙරුණු 'පැහැසරණිය - ශ්‍රී ජයවර්ධනපුර සාහිත්‍යාභිමාන 2023' උළෙල පසුගිය සැප්තැම්බර් 16 වැනි දින මහා නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.



ආරාධිතයින් පිළිගෙන උත්සව ශාලාව වෙත කැඳවා ගෙන එමින්

මේ උළෙල රාජ්‍ය සම්මානලාභී ලේඛක මහින්ද ප්‍රසාද් මස්ඉඹුල සූරීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙහිදී මාධ්‍ය ඒකකයේ සේවයේ නියුතු පුවත්පත් ලේඛක නඳුන් අමන්ද මනමේන්ද්‍ර ආරච්චි මහතා විසි-න් රචිත 'ධර්මසිරි ගමගේ - නිර්මාණාත්මක මානව හිතවාදී සන්නිවේදකයා' කෘතිය දොරට වැඩීමද



ප්‍රධාන සාහිත්‍ය දේශනය පැවැත්වූ මහින්ද ප්‍රසාද් මස්ඉඹුල සූරීන්

සිදුවිය. මෙය කෝට්ටේ මහජන පුස්තකාලයන්හි පරිහරණය උදෙසා සම්පාදනය කර ඇත.

කොළඹ දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ මැතිතුමා ජයග්‍රාහි සිසුවියකට ත්‍යාග ප්‍රදානය කරමින්..



මෙහිදී උළෙල විචිත්‍රවත් කරමින් වාදනයෙන් හා නර්තනයෙන් සහය ලබා දුන් කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලය හා ආනන්ද බාලිකා විද්‍යාලයන්හි සිසු සිසුවියන් හා නිවේදනයෙන් සහය දැක්වූ කොළඹ ආනන්ද විද්‍යාලයේ සත්සර සඳරුවන් හා කොළඹ

25 පිටුවට

විශාකා විද්‍යාලයේ සඳාරා දිත්සඳී යන අය විශේෂයෙන් සිහිපත් කළ යුතුය.

**නාගරික කොමසාරිස්තුමිය අතින් තිළිණ ලබන ජයග්‍රාහි සිසුවියක්**





'ධර්මසිරි ගමගේ - මානව හිතවාදී නිර්මාණාත්මක සන්නිවේදකයා' කෘතියේ මුල් පිටපත, ග්‍රන්ථයේ කතුවරයා විසින් මහින්ද ප්‍රසාද් මස්ඉඹුල සූරීන් වෙත පිළිගැන්වුණු අවස්ථාව

මේ අවස්ථාව සඳහා කෝට්ටේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපති හා කොළඹ දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ මැතිතුමා, පළාත් පාලන සහකාර කොමසාරිස් ප්‍රජා සංවර්ධන නිලධාරිනී (කොළඹ දිස්ත්‍රික්) මල්කාන්ති විජේවර්ධන මහත්මිය, කෝට්ටේ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ශාලිකා එස්. රණවීර මහත්මිය, නාගරික ලේකම් එච්. එම්. දයාරත්න මහතා, නාගරික ගණකාධිකාරී කේ. එම්. පී. කුමාර මහතා, නාගරික ඉංජිනේරු ඩබ්ලිව්. ඒ. එස්. දමයන්ති මහත්මිය, සහකාර නාගරික ඉංජිනේරු අජිත් හෙට්ටිආරච්චි මහතා, ආරාධිත පාසල්වල විදුහල්පතිවරුන්, කෝට්ටේ මහජන පුස්තකාලයන්හි පුස්තකාලයාධිපතිවරුන්, පුස්තකාල හා කියවීම් ශාලා කාර්ය මණ්ඩලය, ආරාධිත පුස්තකාලයාධිපතිවරුන්, විශ්‍රාමික පුස්තකාලයාධිපතිවරුන්, පාඨක සමාජ නිලධාරීන් හා මහා නගර සභා කාර්ය මණ්ඩලය එක් වූහ.

**නිර්මාණී කොඩිකාර**



උළෙල විචිත්‍රවත් කරමින් කෝට්ටේ ආනන්ද බාලිකා විදුහලේ ශිෂ්‍යාවන් පිරිසක් විසින් ඉදිරිපත් කළ නර්තනය

**ත්‍යාග හා සහතිකපත්ලාභී සිසුවියන් පිරිසක් මස්ඉඹුල සූරීන් සමග ඡායාරූපයකට මුහුණ දුන් අයුරු**



**නිවේදනයෙන් සහය වූ සත්සර සඳරුවන් ශිෂ්‍යයා හා සඳාරා දිත්සඳි ශිෂ්‍යාව**





කෙටි කතාව

# බිඳුණු හීන

## කේ. ජී. කෙත්මා රන්සනී (අනුලා විද්‍යාලය - නුගේගොඩ)

**කෝට්ටේ මහජන පුස්තකාල සාමාජික සාමාජිකාවන් අතර මේ වසරේ පැවැති සාහිත්‍ය තරගාවලියේ ජ්‍යේෂ්ඨ අංශයේ ප්‍රථම ස්ථානය දිනාගත් කෙටි කතාව**

"සේපාලි... ඉක්මනට ලෑස්ති වෙන්න. පරක්කු වෙයි ළමයො" අම්මා සාලයේ හිඳ උස් හඬින් මා ඇමතුවාය.

"මං ඉක්මනට එන්නම් අම්මෙ විනාඩියක් ඉන්න."

මම කැඩපත ඉදිරියේ සිට කෑගැසුවෙමි. ළා නිල් පාට රෙද්දේ සුදු පාට පොඩි මල් ඉහිරුණු ගවුම බොඳ වුණු කැඩපතින් ලස්සනට පෙනුණි. දුප්පත්කම උපතින්ම රැගෙන ආ අපට මෙවන් ඇඳුමක් අලුතෙන්ම අඳින්නට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි. මෙයද එවන් අවස්ථාවකි.

"කොළඹ ගියාම සේපාලිට අපිව අමතක වෙයි නේද?"

"මම නවතින්නම යනව නෙවෙයි අක්කා. ගිහින් ආපහු එනවනෙ."

"හැබැයි ඔන්න දිනල මිසක් එනව නෙවෙයි."

කලාපයෙන් ආ ලියුම කියවූ බංචි අක්කා කැකිරාවෙන් ගෙනා ගවුම් රෙද්දෙන් ගවුම මසමින් කී අයුරු මට සිහි විය. කලාපයෙන් පැවැත්වූ චිත්‍ර තරගයෙන් මා ජයග්‍රහණය කර ඇති බවත් මීළඟ තරගය සඳහා කොළඹ යා යුතු බවත් දන්වා මා අත ලියුම තැබුවේ පාසලේ චිත්‍ර ගුරුතුමියයි. එදා සිට මේ දක්වාම මම ඒ සඳහා දින ගණිමින් සිටියෙමි.

"අනේ... අනේ... තාම ඔළුව පීරගෙනවත් නෑ. මොන සිහියෙන්ද ඉන්නෙ?"

පාට සේදී ගිය තිර රෙද්ද මෑත් කර අම්මා මා දෙස දැඩි බැල්මක් හෙළුවේ මා පියවි සිහියට ගනිමිනි.

මම හැඩපළු ගෙතුණු කොණ්ඩය ඉක්මනින් පීරන්නට වීමි. පනාව හිස කෙස් අතර දිව යද්දීත් සිතට නැඟුණේ කොළඹ ලෝකයයි. කොණ්ඩයේ තැවරී තිබූ පොල් තෙල් සුවඳ නැහැයට දැනෙන්නට විය. එය අපට උරුම සුවඳයි. ඒ සුවඳ වෙනස් කිරීමට මගක් නොවෙද මා මේ සොයන්නේ? මම ඉණ තෙක් වූ කොණ්ඩය හොඳින් පීරා තනි කොණ්ඩයක් වන සේ ගෙතුවෙමි. තව දෙතුන් සැරයක් හැඩ බැලූ මා සාලයට ගියේ බෑගය සූදානම් කිරීමටය.

නිල් හා කහ කොටු රෙද්දෙන් මැසූ බෑගයට මම බඩු අඩුක් කළෙමි. කැකිරාව හන්දියෙන් ගෙනා සුදු පාට කොළ දෙක, අලුත් පැන්සල හා තෑගි ලැබූ පාට පෙට්ටිය ඒ අතර විය.

"මේක මට අය්යා රටින් එව්වෙ. ඔයා ගෙනියන්නෙ තරගෙකටනෙ. ඕකෙන් හොඳට පාට වෙනවා."

"අනේ මේව නම් නැතුවට කමක් නෑ."

මම අදි මදි කළෙමි.

"එහෙම කියන්නෙපා ඔයා කොහොම හරි දිනන්න

27 පිටුවට

ඕනෙ. අපේ බංචි අක්කා නම් කිව්වා ඒකෙන් දින්න-ාම සල්ලිත් හම්බ වෙනවලු."

චුට්ටි විසින් අලුත්ම අලුත් පාට පෙට්ටියක් තෑගි දෙමින් කී අන්තිම වචන ටික, මට එය බෑගයට දමන විටත් මතක් විය. ඒ වචන ළඟ මගේ හිත නැවතුණා කීවොත් නිවැරදිය. කෙසේ හෝ තරගය ජය ගෙන එම මුදල ලබාගැනීමේ දැඩි උවමනා-වකින් මා පෙළුණේ මේ දුකෙන් දෙමාපියන් මුද-වා ගැනීම උදෙසාය. එම මුදල ගත් පසු සිදුකරන කටයුතු පිළිබඳ සිහින ලොවක මගේ ළමා මනස සැරිසරන්නට විය.

"හුඟක් දුර යන්නත් එපැයි. මං හැලප හැදු-වා. යන ගමන් කන්ඩ පුළුවන්නෙ. තාත්තත් එක්ක කාපං." අම්මා පත්තර පිටුවක එතූ හැලප දෙකක් මා අත තැබුවේ මහත් සෙනෙහසිනි. මා කුඩා කල තිබූ පිරිපුන් රුව දැන් ඇයගෙන් කෙමෙන් කෙමෙන් දිය වී යයි. ඒ බව සිතූ මට හිල්ලුණේ ඉබේටමය.

මම බෑගයත් රැගෙන නැඟී සිටියෙමි. අම්මාත් තාත්තාත් සිය එකම දියණිය දෙස ඉමහත් සෙනෙහසින් බලා සිටින්නට විය. සැබවින්ම ඔවුන්ට දියණියකටත් පුතකුටත් සිටි එකම දරුවා මම වීමි.

"මම ගිහිං එන්නං අම්මෙ."

මල් මල් චිත්ත රෙද්දට පහළින් රැළි ඇගේ දෙපා නමදිමින් මම පැවසුවෙමි.

"මගේ පුතාට තුනුරුවන්ගෙ ආරස්සාව ලැබෙන්න ඕනෙ. පුතා දස්සයා. ඒ නිසා අනිවාරෙන්ම දිනනව. මං දන්නවනෙ."

මා දෙවුරින් අල්ලා නැඟිට්ටවා හැට්ට කරට තුරුලු කරගත් ඇය හිස පිරිමදිමින් කීවේ මහත් ආඩම්බරයකිනි. මේ වන විටත් මුලු ගමටම ඇය එසේ කියා අවසන්ය. ඒ ඇයගේ විදිහයි. ඇය පමණක් නොව ඕනෑම මවක් තම දරුවන් පිළිබඳ ඉහළින් වර්ණනා කිරීමට කැමතිය. එය විස්මයට කරුණක් නොව, මවු සෙනෙහස යනු එයයි.

"අපි යමු අප්පච්චි." මවගේ මුහුණ දෙස මඳක් බලා සිටි මම අප්පච්චිගේ පා නැමදුවේ තවත් ප්‍රම-ාද විය නොහැකි බැවිනි. කඩුල්ල අසලට පැමිණි මට තවත් වරක් නිවස දෙස බැලීමට වුවමනා විය. කපරාරු නොකර ගඩොලින් බැඳ තිබූ බිත්තියට හේත්තු වී අප දෙස බලා සිටි මව කහට බැඳුණු දත් පෙන්වා සිනාසෙන්නට වූවාය. තරුණ බව වියැකෙමින් තිබුණද ඇයගේ සිනහව තවමත් ප්‍රා-ණවත්ය.

කැකිරාව බස් නැවතුම් පොළ තෙක් එන මගෙහි සිටි බොහෝ දෙනෙක් මට සුබ පතන්නට විය. ඔවුන් සියලු දෙනා බලාපොරොත්තු වන්නේ මා ජයග්‍රහණය කරන බව ඔවුන්ගේ කතා බහින් වැටහිණි. අපි අසල නවතා තිබූ බස් රථයට නැඟ ගත්තෙමු. එහි පුවරුව මත 'කැකිරාව - අනුර-ාධපුරය' යැයි සඳහන්ව තිබුණි. මටත් අප්පච්චීටත් එක ළඟ අසුන් දෙකක් ලැබිණි.

මම ගවුම පොඩි නොවන සේ පරිස්සමින් හිඳ ගත්තෙමි. එය ඊයේ දිනයේදී රොස්ලින් නැන්ද-ලාගේ පොල් කටු ඉස්තිරික්කයෙන් මැදගෙන එන ලද්දේ අම්මා විසිනි. යම් කිසි වැදගත් ගමනක් යාමට ඇත්නම් එහි ගොස් ඇඳුම් මැදගෙන එනවා මිසක නිතරම මදින ලද ඇඳුම් ඇඳීමෙහි පුරුද්දක් අපට නොමැත. කල්පනාව නිසා නොතේරුණු නමුත් අපි ඉක්මනින්ම අනුරාධපුරයට පැමිණ සිටියෙමු. අනුරාධපුරයෙන් බැසගත් අපි කොළඹට යන බස් රථයකට නැඟ ගත්තෙමු.

"බොරැල්ලට දෙකයි."

තාත්තා ටිකට් පත් අරගන්නට විය. මම ජනේලයෙ-යන් පිටත බලා සිටියෙමි. කාලය ටිකෙන් ටික ගෙවෙමින් තිබිණි. පුරුදු අහස යටින් කොළඹ අහසට යන්නට හෝරා කිහිපයක් ගත විය. වී කරලි-න් බර වුණු කුඹුරු යායවල් අතරින් බස් රිය වේගයෙ-යන් ඇදෙන්නට විය. අහස උසට නැගුණු සිමෙන්ති ගොඩනැගිලි මතු වන්නට විය. රූස්ස පොල් ගස් වෙනුවට උස් වූ දුරකථන කුලුනු, ලයිට් කණු දිස් විය. පුරුදු සුළඟ අතුරුදන් වී ගොස් තිබිණි. සිතට අමුතු හැඟීමක් දැනෙන්නට විය. මා කොළඹට පය තබන පළමුවැනි අවස්ථාව මෙයයි. වසර දොළහක් යන තුරුම මා කොළඹ දැක තිබුණේ නැත.

"අප්පච්චි, කොළඹ මොන වගේද?"

පළමුවැනි වරට කොළඹ පිළිබඳ ඇසූ දින මා ඒ පිළිබඳ අප්පච්චීගෙන් විමසූ අයුරු මතකය. එදින ඔහු පැවසූ උස් වූ ගොඩනැගිලි දැන් මගේ දෑස් ඉදිරිපිටය. මේ අප්පච්චීගේ තුන්වැනි කොළඹ ගමනයි. ඔහු මින් පෙර දෙවතාවක්ම පැමිණ තිබුණේ කුලී වැඩ සඳහායි. අපවත් කැටුව පැමිණීමට අවැසි වුවද කුලී රස්සා කළ අප්පච්චීට ඒ සඳහා වත්කමක් නොවීය.

"බොරැල්ල බොරැල්ල බහින්න."

කොන්දොස්තර මහතාගේ කෑගැසීමට මම තිගැස්සුණෙමි. "පොඩ්ඩි, එහෙනම් අපිත් බැහැග නිමු."

28 පිටුවට

අම්මා සේපාලි යැයි ඇමතුවද අප්පච්චී මා ඇමතුවේ 'පොඩ්ඩී' යන නාමයෙනි.

"පොඩ්ඩිට බඩගිනිත් ඇතිනෙ. අපි තේකක් බීලම යමු. තව වෙලාත් තියෙනවනෙ."

අප්පච්චී ඔරලෝසු කණුව දෙස බලාගෙනම පැවසීය. අපට තරගයට සහභාගී වීමට තිබුණේ දහවල් එකටය. තවම වේලාව දොළහයි කාල විය. අප්පච්චී සෙනග පිරුණු මාවත් අතරින් මා කැටුව යන්නට විය. අසලින් යන්නවුන්ගේ සැර සුවඳ විලවුන් සුවඳට මගේ හිස කකියන්නට විය. මම බෑගයත් තුරුලු කරගෙ නම අප්පච්චී පිටුපසින් ඇදුණෙමි. විවිධ අලංකාර ගොඩනැගිලි, වීදි දෙපසම විය. නැවත ගමට ගිය පසු ළමයින් හා පැවසීමට සිහිවටන ලෙස මම ඒවා මතක තබාගතිමි. ලයිට් කම්බි මත පේළියට වසා සිටි කපුටන් සහ පරෙවියන් නිතැතින් නෙත ගැටිණි. අපි කුඩා කඩයකට ඇතුළු වීමු.

"තේ දෙකක් දෙන්න."

අම්මා ඔතා දුන් හැලපය තිබූ නිසා තේ පමණක් ප්‍රමාණවත් විය.

"මහත්තය, බොරැල්ල කලා සංගමය කොහෙද?" අප්ප්ච්චී බයාදු ලෙස අසල සිටි අයකුගෙන් විමසුවේ තේ බී අවසන්ව එළියට පැමිණි විටය.

ඔහු කියූ මග ඔස්සේ අප බොහෝ අපහසුවෙන් ස්ථානය සොයා ගත්තෙමු. එහි නිල් සහ සුදු පැහැ ආලේපිත දෙමහල් ගොඩනැගිල්ලක් විය. 'කලා සංගමය - බොරැල්ල' යනුවෙන් සඳහන් විශාල පුවරුවක් එහි ඉදිරියේ විය.
"මහත්තය, චිත්‍ර තරගයට..."

අප්පච්චී පහත් ස්වරයකින් ඇසීය.

"උඩට යන්න."

මුහුණ දෙසවත් නොබැලූ ඔහු දැඩි ස්වරයකින් පැවසුවේය. මම අප්පච්චීත් සමග උඩු මහලට පිවිසියෙමු. එය සුදු තීන්ත ආලේපිත විශාල ශාලා- වකි. ශාලාවේ බිත්ති මත විශාල සිතුවම් එල්ලන ලද පුවරු විය. ශාලාව ඉදිරිපස කෙළවරෙහි සාරියක් හැඳගත් කාන්තාවක් සිටියාය. නමුත් එහි වෙන කිසිවකුත් සිටියේ නැත. ඩෙනිම් කලිසමක් සහ ටී ෂර්ටයක් හැඳ සිටි එක් ළමයෙක් පමණක් අප අසලින් පිට විය.

"එන්න පුතේ, අපි අර නෝනගෙන් අහමු."

මම අප්පච්චි පිටුපස ඇදෙන්නට වූයේ හිස් වූ මේස පුටු අතරිනි.

"ඔයා ඔතන ඉන්න. මං ගිහිං එන්නං."

පසෙක වූ පුටුවක් මත හිඳගන්නට මට උපදෙස් දුන් අප්පච්චී එම කාන්තාව අසලට ගියාය. කියූ දේ පැහැදිළිව නොඇසුණත්, ඇය කිසිම ගරු සරුවකින් තොරව කතා කරන බව මට දැනුණේ ඇගේ අංග චලනයන්ගෙනි. ඇයගෙන් දෑස් ඉවතට ගත් මා වට පිට බලන විට දුටුවේ මේසයක් මත වූ චිත්‍ර ගොඩකි. ඒවා කුඩා ළමුන් විසින් ඇඳ තිබිණි. දැන් නම් මගේ සිත කුඩා බියකින් සලිත වන්නට විය.

"පුතේ..."

අප්පච්චී මා වෙත පැමිණියේ බලාපොරොත්තු සුන් වූ, මැළවුණු දෑසිනි.

"ඇයි අප්පච්චී...? ඒ නෝනා මොකද කිව්වෙ?"

මම දැඩි කුතුහලයකින් විමසුවෙමි.

"තරගය ඉවරයිලු පුතේ..."

"මොනව...?"

මගේ හිසට හෙණ පහරක් වැදුණා බඳු විය.

"ඔව් පොඩ්ඩි, තරගය තිබිල තියෙන්නෙ එකොළහට."

"මේකෙ ඉලක්කම් පැහැදිළි නෑනෙ. පළුදු වෙලා වගේ සේපාලි."

බංචි අක්කා කී අයුරු මට සිහි විය.

"කොළඹ ඉඳං එනකොට ඔහොම තමයි."

මම එදින සැහැල්ලුවෙන් එය ඉවත දැමුවත් අද එය මගේ මුලු සිහින ලොවම සුන් කරන්නට විය.

"අපේ බංචි අක්කා කිව්වා ඒකෙන් දින්නම සල්ලිත් හම්බෙනවලු."

චුට්ටිගේ වදන් හිත තුළ දෝංකාර දෙන්නට විය. අම්මාගේ අහිංසක සිනහවට දැන් මං මොනවා කියන්නද? සියල්ලෝම බලාපොරොත්තුවෙන් දෑස් දල්වා සිටින්නේ මා ජය ගෙන තෑගි බෝගත් රැගෙන පැමිණෙයි කියාය.

නමුත් දැන්,

තෑගි බෝග තබා චිත්‍රය ඇඳීමටවත් මට නොහැකි විය.

මා පරිස්සමින් රැකගත් වීදුරු බඳුන බිඳී ගියාක් වැනි හැඟීමකින් හදවත පෙළන්නට විය.

**කෝට්ටේ මහජන පුස්තකාල සාමාජික දරු දැරියන් අතර මේ වසරේ පැවති සාහිත්‍ය තරඟාවළියේ තවත් ජයග්‍රාහී කෙටිකතාවක් ලබන කලාපයේ පළකෙරේ.**

# තේසර විල

ඔබගේ
නිර්මාණාත්මක කවි හා නිසැඳැස්
අපට එවන්න
kmcmediaunit3@gmail.com

## ගස් දෙකක් - හුදකලා නිම්නයක



කොළ පාට තණ පතින් එළා පාවඩ බිමට
කහ පාට රතු පාට මල්වලින් හැඩ කෙරුව
හුදෙකලා නිම්නයක තනිවෙලා අප දෙදෙන
එකිනෙකාගෙන් අසයි ඔබ කවුද මම කවුද

මිනිස් පා පහස නැති ඉඳුල් නැති සම බිමක
කොහෙන් හෝ ඇවිත් අපි මුල් දමා මේ බිමට
නැඟී සිට බලන්නෙමු හුදෙකලා මිහිර මැද
මේ බිමෙහි අස්වැදුම කළ යුත්තෙ අපි නොවෙද

ඈත සිට අප වෙතට පාව එන මඳ නළෙක
දවටලා රැගෙන එන සරු බිමක රේණු බිඳ
අරන් බැතියෙන් පෙමින් සතපවා කලංකෙක
හෙට දිනේ අපි පුදමු ජීවයක් මේ බිමට

හුදෙකලා නිම්නයම තුරුවැලෙන් ගැවසගෙන
අතු අගින් මල් රැගෙන සියොතුන්ට අත වනන
දිනෙක එයි අපි දෙදෙන මේ බිමෙන් සමුගන්න
දිවි දහම වැළඳගෙන එකට යමු අපි එදින

**සුජීව ඉන්දික සිරිවර්ධන**

## දෙවියෝ තැති ගෙන මහ පොළොවට එති

අගිල් කපුරු හරි චන්දන දීප ධූප දී
සුගන්ධයෙන් නන්දිත වී දෙරණාත පෙරැළී
නුබ ගැබවාසී
කෙළ සුවහස් දෙවියන්ගෙන්
පිහිට පතන විට,
සඳ විජයෙන් ජය ගත් ආම්ස්ට්‍රෝංගේ
පා රොන් හිසින් රැගෙන
දෙවියෝ එති
මහ පොළොවට
සාදු නද පවත්වමින්,
මානවයන්හට නමස්කර කොට
විශ්ව විනාශය වළකාලන ලෙස
අයැද සිටීමට



**තිලකරත්න කුරුවිට බණ්ඩාර**

(අපේ පුරවරයේ කීර්තිමත් පුරවැසියකු මෙන්ම, පුරා හැට වසරක පමණ කාලයක් තුළ පුවත්පත් කලාවේදියකු ලෙසින් හා ගීත රචකයකු, කවියකු, කලා විචාරකයකු ලෙසින් නිරත වූ කීර්තිමත් යුග මෙහෙවර ඇගයෙමින් ඔහුගේ 'දෙවියෝ තැති ගෙන මහ පොළොවට පැමිණෙති' කාව්‍ය සංග්‍රහයෙන් මෙසේ උපුටා පළ කළ කරන ලදී.

## ජීවිතය . . .



**කිසිවක් නොදැන මෙලොවට පැමිණ**
**අමරණීය මිනිසුන් ලෙසට**
**කෙටි කලකින් දේපළ වස්තුව නෑ පිරිවර**
**තමන් සතු කරගෙන,**
**දිගු කලක් ගෙවීමට**
**සියලු පැනයන්ට විසඳුම් සොයන අතරදි**
**නොදැනුවත්වම දිවිය අවසන් මොහොත**
**පැමිණි විට,**
**මගේ යැයි රැස්කළ කිසිවකට**
**නොහැක දිවිය රැකුමට**

**ජී. එච්. සී. දිල්රුක්ෂි**
බැද්දගාන පුස්තකාලය




## ඇයි..? පැණි රස කෑම නිතර ගැනීමෙන් දත් දිරන්නේ ඇයි?

පැණි රස ආහාර ගැනීමේදී ඒවායේ කුඩා කොටස් දත් හා විදුරුමස අතර රැඳේ. මෙම ආහාර කොටස් මත බැක්ටීරියා ආදිය ක්‍රියාකාරී වීම නිසා අම්ල වර්ග සාදයි. මෙම අම්ල වර්ගවලින් දත්වල එනැමලයේ කොටස් පහසුවෙන් දිරාපත් වේ. මේ නිසා දත් දිරා යයි.

## ලෝකේ වටේ





### ඉන්දියාව

දකුණු ආසියානු රටකි. භූමි ප්‍රමාණය අතින් ලොව සත්වැනි තැන ඉන්දියාවට හිමි වේ. චීනයට පසුව ලොව වැඩිම ජනගහණය වෙසෙන රට වේ.

**අයත් වන මහාද්වීපය** - ආසියාව

**විශාලත්වය** - වර්ග කිලෝමීටර 3, 287, 590

**අගනුවර** - නවදිල්ලි

**මුදල් ඒකකය** - ඉන්දියානු රුපියල්

**නිල භාෂාවන්** - හින්දි සහ ඉංග්‍රීසි (ප්‍රාදේශීය වශයෙන් භාවිත වන භාෂා 14 ක් පමණ ඇත.)

**ප්‍රධාන අපනයන භාණ්ඩ** - රෙදි පිළි, ආභරණ, සම් භාණ්ඩ, යපස්, තේ, මත්ස්‍යයින්

**ප්‍රධාන ආනයන භාණ්ඩ** - බොර තෙල්, යකඩ සහ අගනා මැණික් වර්ග

## සිරිත් මල්දම

'සිරිත් මල්දම' පුංචි ඔබ තුළ යහපත් ගතිගුණ පුරුදු පුහුණු කරවීමට අවශ්‍ය අවවාදවලින් සමන්විත කවි පොතකි. මෙය රචනා කර ඇත්තේ විශ්‍රාමික පාඨශාලාචාර්යවරයකු වූ ඇම්. ඇල්. ද සිල්වා විසිනි. මේ පළවන්නේ එහි එන කවියකි. මේ කවිය කියවා තේරුම් ගෙන ඒවායින් කියවෙන ආකාරයට ඔබගේ ජීවිත හැඩගස්වා ගන්න.

**අනුන්ගෙන් නැති උන**
**දෙයක් ලැබුණොත් යම් දින**
**එය සඟවා නොගෙන**
**දෙන්ට කරුණා සිතින් සතුටින**

අනුන්ගේ නැතිවුණු දෙයක් කෙදිනක හෝ ඔබට ලැබුණහොත් එය සඟවා තබා නොගෙන සතුටින් ආපසු දීමට තරම් කාරුණික වන්න.




පුංචි ඔබගේ නිර්මාණ මේ පිටුවේ පළ කිරීම සඳහා එවන්න

kmcmediaunit3@gmail.com

**මුද්දර එකතු කරමු**


# ලෝකයේ මුල්ම තැපැල් මුද්දරය




මුද්දර භාවිතයට පෙර සිටම තැපැල් සේවය ලොව පුරා ක්‍රියාත්මක විය. මුල් කාලයේ තැපැල් සේවයෙන් ප්‍රයෝජන ලබාගත්තේ ආගමික පූජකවරුන්, රාජකීයයන්, ප්‍රභූවරුන් හා ධනවතුන් පමණි. තැපෑල පොදු ජනතා සේවයක් බවට පත්කරවීමට මුල් වූයේ බ්‍රිතාන්‍ය ජාතික ශ්‍රීමත් රෝලන්ඩ් හිල් ය.

එකල කිසියම් කෙනකුට ලිපියක් ලැබුණු විට ඒ වෙනුවෙන් එය ලබන තැනැත්තා ගාස්තුව ගෙවිය යුතු විය. එම ගාස්තුව ලිපියේ පිටු ගණන, බර, රැගෙන යන දුර ප්‍රමාණය අනුව වෙනස් විය. ඒ වෙනුවට ලිපිය ලබන්නාගෙන් තැපැල් ගාස්තුව අය කළ යුතු බවට යෝජනා කරන ලද්දේ ශ්‍රීමත් රෝලන්ඩ් හිල් විසිනි. ඔහුගේ මෙම යෝජනාවට අනුව 1840 මැයි මස 06 වැනි දින සිට ලිපි තැපැල් කිරීමේදී ගාස්තුව අය කිරීම වෙනුවෙන් එම වටිනාකමට සමාන ලේබලයක් ඇලවීම සිදුවිය. එය තැපැල් මුද්දරයයි.

1846 මැයි 06 වැනි දින ලෝකයේ මුල්ම තැපැල් මුද්දරය බිහි විය. එය 'පෙනී බ්ලැක්' (Penny Black) නම් විය. එංගලන්තයේ වික්ටෝරියා රැජිනගේ උඩුකය රූපය මෙම මුද්දරයෙන් නිරූපණය විය.



මුද්දරය සඳහා මෙම රූව උපුටා ගන්නා ලද්දේ ප්‍රකට මූර්ති ශිල්පියකු හා කැටයම්කරුවකු වූ විලියම් යොන් නිර්මාණය කළ ශිල්ඩිහෝල් පදක්කමෙනි.

පෙනී බ්ලැක් මුද්දරයේ වටිනාකම පැන්ස 01 කි. මෙම මුද්දරයේ එකිනෙක වෙන් කරන සිදුරු හෙවත් විදුමන් නොවීය. මුද්දර වෙන් කර ගැනුණේ කතුරකින් කපා ගැනීමෙනි.

මෙම මුද්දරයේ එය මුද්‍රණය කරන ලද රට සඳහන් නොවීය. එතැන් සිට එංගලන්තය නිකුත් කරන කිසිදු මුද්දරයක හෝ එම රටේ නම සඳහන් නොකෙරේ. එය ලොවට මුල්ම තැපැල් මුද්දරය හඳුන්වා දීමට ගරු කෙරෙමින් විශ්ව තැපැල් සංගමය එංගලන්තයට ලබා දී ඇති විශේෂ වරප්‍රසාදයකි.

## අපේ සිංහල පන්තිය – තනි පද

- අනුන් ගැන සිතන - පරාර්ථකාමී
- අහස හා මුහුද එකට එක්ව පෙනෙන ස්ථානය - ක්ෂිතිජය
- අන් අයට යටත් - පරාධීන
- අනුන්ගේ සැප සම්පත් දැක අසතුටු වීම - ඊර්ෂ්‍යාව
- අවවාද දෙන තැනැත්තා - අනුශාසක
- අලුත් රටවල් සොයා යන්නා - දේශගවේෂක
- අනුන් කරන දේ බලා තමාද එය කිරීම - අනුකරණය
- අයහපතක් කිරීමට රහසේ කරන සාකච්ඡාව - කුමන්ත්‍රණය
- අශ්වයාගේ නාදය - හේෂාරවය
- අනුන්ගෙන් යැපෙන - පරපෝෂිත, පරපුටු

## නොවැම්බර් මාසයේ වැදගත් දින

- නොවැම්බර් 01 - ලෝක නගර නිර්මාණ දිනය
- නොවැම්බර් 11 - පොපි මල් දිනය
- නොවැම්බර් 14 - ලෝක දියවැඩියා දිනය
- නොවැම්බර් 17 - ලෝක ධීවර දිනය
- නොවැම්බර් 21 - ලෝක රූපවාහිනී දිනය

# කතා කරන පින්තූර

## මහ සයුරේ පාවෙන සුර විමන

## Icon of the Seas

මෙතෙක් ලොව ඉදිකර ඇති විශාලතම සංචාරක මගී නෞකාව වන මෙය Royal Caribbean International සමාගමේ නිර්මාණයකි. දිග මීටර් 365 කි. ගමන් කළ හැකි උපරිම මගීන් ප්‍රමාණය 7600 කි. 2022 දෙසැම්බර් 09 වැනි දින මංගල ගමන් ඇරඹූ මෙය සංචාරකයින් සඳහා උපරිම මට්ටමේ පහසුකම් හා වින්දනීය අත්දැකීම් සහිත අපූර්ව නිමැවුමකි.












තොරතුරු හා ඡායාරූප ඃ අන්තර්ජාලය ඇසුරිනි